
# බ්‍රිතාන්‍ය පාලනයේ ජාතිවාදී ප්‍රයත්නය



# පෙර වදන

1949දී පෙඩරල් පක්ෂය පිහිටවීමටත්, 1976 දී ද්‍ර.එ.වි. පෙරමුණ පිහිටවීමටත් මුල්වූ ඓතිහාසික සාධකය හියූ ක්ලේගෝන්ගේ වාර්තාවයි. රනිල් වික්‍රමසිංහ හා සම්බන්දන් මහතුන් දෙපලටම 1977 සිට එකම සිහිනයක් තිබූ බව පාර්ලිමේන්තුවේ කල ප්‍රතිපත්ති ප්‍රකාශයේදී සදහන් කලේය. එසේ නම් ඒ සිහිනයේ පදනම 1976 ද්‍ර.එ. වි. පෙරමුනේ ප්‍රකාශයද නැත්නම් ක්ලේගෝන් සටහන ද නැත්නම් ඒ දෙකමද? එසේ නැත්නම් 1819 ජනවාරි මස වෙස්ලියන් පල්ලියේ මූලිකත්වයෙන් ගාල්ලට රැස්වී මිෂනාරීන් ලංකාව දෙකට බෙදීමට ගත් තීන්දුවද? මින් කුමක් වුවත් ඒ සියල්ලේ පදනම අසත්‍යවේ. 1819 රට දෙකට බෙදීමට මිෂනාරීන් ගත් තීන්දුව ඌව වෙල්ලස්ස විමුක්ති සටන මෙල්ල කිරීමේ මහා මිනිස් ඝාතනය සදහා පාවිච්චි කල තුවක්කුවල උණුසුම නිවීයාමටත් පෙර ගන්නා ලද්දකි. මේ මිෂනාරි තීන්දුව නිසා ක්‍රිස්තියානි පල්ලි හැමවිටම රට බෙදීමට පක්ෂව සිටී. පෙඩරල් පක්ෂයේ නායක චෙල්වනායගම් දෙමළ ජනතාවට පොරොන්දු දේශය ලබා දෙන මෝසෙස් ලෙස හැදින්වන්නේද ඒ නිසාමය. සමහර විට මේ දෙදෙනාගේ සිහිනය පල්ලියේ උපදෙස් අනුව උපන්නා විය හැක?

දැනටමත් නැගෙනහිර පදිංචි සිංහල බෞද්ධ ජනයා ගම්බිම්වලින් ඉවත් කරමින් පවතී. මේ කුඩා පොත් පිංචෙන් මා උත්සාහ කරන්නේ ඊනියා තීන්දුවලට බලපාන ඓතිහාසික පදනම පැහැදිලි කරමින් ජාතිවාදයේ මහා ප්‍රෝඩාව රටට හෙලි කිරීමටයි. උතුරු හා නැගෙනහිර පළාත්වල ඇති නටබුන් වූ ඓතිහාසික වෙහෙර විහාර ආරක්ෂාකර ඒවා සංවර්ධනය කිරීමට එහි රැදී සිටින භික්ෂූන් වහන්සේලා දැඩි කැප කිරීමක් කරති. එහෙත් රජය එම ස්ථාන හුදකලා කරමින් සිටී. රැකගතයුතු පුරාවිද්‍යාත්මක ස්ථාන අවට රජයේ ඉඩම් ප්‍රාදේශීය ලේකම්ලාගේ බලතල අනුව අන්‍ය ආගමිකයින්ට බලපත්‍රමත බෙදාදීමෙන් එම ස්ථාන අනාරක්ෂිත කර ඇත. සමහර ඉඩම් බෙදදීමේදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව නොවිමසා ක්‍රියාකරමින්, එහි

වැඩවසන ස්වාමීන් වහන්සේලා ඉඩම් ආරවුල්වල පටලවා ඇත. උන් වහන්සේලා ඉතා දුකසේ රැකගත් මේ ස්ථානවලින් ඉවත් නොකර ඉවත්වයාමට කටයුතු සලසන්නේ අගනා ස්ථාන ඩෝසර්කර සැබෑ ඉතිහාසය මකා දැමීමේ අරමුණෙන් බව පෙනේ. දැනටමත් පෞරාණික ස්ථාන ගණනාවක් ඩෝසරකර විනාශ කර ඇත. එම ඓතිහාසික ස්ථාන වැඳපුදා ගැනීමට වෙනත් ප්‍රදේශවලින් යන භික්ෂූන් වහන්සේලාට හෝ ගිහියන්ට එම ස්ථානවලට ඇතුල්වීමටද අවහිරතා ඇත. මේ ස්ථාන හුදකලා කල පසු ඒවා හින්දු කෝවිල්කර ආරවුලක් නිර්මානය කිරීමට ඉඩ සැලසේ. බෞද්ධයන් හින්දු කෝවිල් ආක්‍රමණය කරන බව ප්‍රචාරය කිරීම දැනටමත් ඉන්දියාවේ දේශපාලනඥයින් විසින් ආරම්භකර ඇත.

රටේ නීතිය අනුව පුරා වස්තු ආරක්ෂා කලයුතුය. බුදු සසුන ආරක්ෂා කර පෝෂණය කිරීමට ව්‍යවස්ථාවෙන් රජය බැඳී සිටී. එහෙත් 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කිරීමට තමන් බැඳී සිටින බව කියති. ඉන්දියානු පිඩනයට අනුකූල වූ ජේ ආර්. ජයවර්දන ජනාධිපතිතුමා ඉන් ගැලවීමට ප්‍රයෝගයක් සකසා තිබිනි. දැන් ප්‍රශ්නය එම ප්‍රයෝගය මග හැරීමයි. ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ සභාපති අමිර්තලිංගම් මහතා, අගමැති රජිව් ගාන්ධිට කියා සිටියේ ලංකාවේ පලමු යටත් විජිත ලේකම් හියු ක්ලේගෝන් විසින් උතුරු නැගෙනහිර දෙමළ ප්‍රදේශ බව සදහන් කර ඇති නිසා එම අයිතිය ඔවුන්ට ලබාදෙන ලෙසටයි. එහෙත් නෝර්ත් ආණ්ඩුකාරයාම කියා ඇති පරිදී එකී, හියු ක්ලේගෝන් කිසිම ප්‍රතිප්‍රතිපත්තියක් නැති පල්හොරෙකි. 1800 දී ඔහුව සේවයෙන් පහකර රටින් පිටුවහල් කර සර් ෆෙඩ්‍රික් නෝර්ත් සැනසුම් සුසුමක් හෙලා ඇත. සිංහල බෞද්ධයින් වන අපටද සැනසුම් සුසුම් හෙලිය හැක්කේ සෙසු ජන කොටස් සමග සාමයෙන් සිටීමෙනි. ඉංග්‍රීසීන් පැමිනීමට පෙර සිටියේ, සමගි සම්පන්නවය. අපට එසේ විසීමට අසල්වැසි ඉන්දියාව අපගේ රටට කලණ මිතුරෙක් විය යුතුමය.

**පියසිරි අමරකෝන් 0777337661**

# <u>හැඳින්වීම</u>

අප රට මුහුන පා සිටින බරපතළම ප්‍රශ්නය වාර්ගික අර්බුදයයි. ඒනිසාම 30 අවුරුදු යුද්ධයකටද නොයෙක් සිවිල් කලකෝලාහල හා ගැටීම්වලටද මුහුණ පා මිනිස් ජීවිත දහස් ගනනින් විනාශ විය. රට අන්තර්ජාතිකවද බරපතළ පීඩාවකට ලක්කර ඇත. එවන් දුක්බර ප්‍රතිඵල දුන් මේ ප්‍රශ්නය හිතාමතා නිර්මාණය කල දෙයක් බව කීවොත් ඔබ එකවර පුදුමයට පත්වෙනවාට සැකයක් නැත. අප මුහුණපාන වර්තමාන ආර්ථික අර්බුදයටද මේ ප්‍රශ්නය පාදක වී ඇතැයි මගේ විශ්වාසයයි. ආර්ථික සංවර්ධනයට දෙමළ ඩයස් පෝරාවේ මුදල් ආයෝජන සඳහා පාර කැපීමේ සැඟවුනු අර්ථය එයයි. වාර්ගික ප්‍රශ්නයට මේ දෙන්නේ අවසාන විසඳුම නම් එය ජාතිය අනතුරේ හෙළීමකි, ඉන් සිදුවිය හැක්කේ ප්‍රශ්නය තේරුම් නොගෙන විසඳුම් සෙවීම නිසා මහ අවුලකට මග පෑදීමයි. ප්‍රශ්නය විසදා ගැනීමට අපට තිබෙන අවසාන අවස්ථාවද මින් අහිමිවනු ඇත. ඒනිසා ඉදිරියේ සිදුවිය හැක්කේ මේ සම්බන්ධයෙන් කිසිවක් කර කියාගත නොහැකි තත්වයට අපව පත්වීමයි. මේ උගුලෙන් අප කෙසේ හෝ ගැලවිය යුතුමය. ඉන් ගැලවීමේ එකම මාර්ගය නම් මේ ගැටලුව කවුරුන් කෙසේ ඇතිකල දෙයක් දැයි නිවැරදිව දැන ගැනීමයි. එවිට අපට විසඳුමක් හමුවනු ඇතිවා මෙන්ම මෙය සිංහල දෙමළ ප්‍රශ්නයක් නොවන බව වැටහෙනු ඇත.

පලස්තීනුවන් සිය භූමියෙන් එලවාදමද්දී අපේ රටේද නැගෙනහිර ගම්මානවලින් ඉවත්වීමට පාරම්පරික වාසීන්ට දැනටමත් නියෝග කර ඇත. ජාතික උරුමයන් වූ නටබුන් වූ පන්සල් රැකගැනිමෙහිලා දුක් මහන්සියෙන් කටයුතු කරන භික්ෂූන් වහන්සේලා එම ස්ථානවල හුදකලා කිරීමට කටයුතු සලසා ඇත. සිංහලය නම් වූ

මේ රටේ අවුරුදු දහස් ගණනක සිට පැවත එන උරුමයන් අහිමි කිරීම හා විනාශ කිරීම හමුවේ ඊට එරෙහිව කටයුතු කිරීමට රජය අපොසත්වීම මේ ව්‍යසනය උත්සන්න කිරීමට හේතුවී ඇත. රජය අසමත්ව ඇත්තේ ඉන්දියාව බලපෑම් කරන නිසාද, නැත්නම් මේ රටට පා තැබූදා සිට ජාතිය භේදබින්න කිරීමට කටයුතු කල බ්‍රිතාන්‍ය බලපෑම් කරන නිසාද, නැත්නම් 1813 සිට මේ රටේ කටයුතුවලට ආගමික ව්‍යාප්තිය මූලික කරගෙන යාපනයට පැමිනි ඇමෙරිකනුවන්ගේ බලපෑම් නිසාද, යන්න ප්‍රශ්නයකි. පලස්තීනුවන් පිලිබද ගැටලුවට බටහිර රටවල් සම්බන්ධ බව ලොවම දනී. අප රට තුල සිදුවන්නේද එම න්‍යායේම ක්‍රියාවක් බව පෙනේ. බ්‍රිතාන්‍ය පාලනයේ මුල සිටම අප රට තුල අවුල් ඇති කිරීමට ක්‍රියාකල ආකාරය පාලන යුග ඇසුරින් අප විමසා බලමු.

## මද්‍රාසි පාලනය

ප්‍රශ්නයේ ආරම්භය 1796 වර්ෂය හෙවත් ඉංග්‍රීසීන් මුහුදු බඩ පළාත් අල්ලා ගත් කාලය දක්වාම විහිදේ. ඉංග්‍රීසීන් පැමිනි මුල් වර්ෂයේම කිසිම සාධාරණ හේතුවක් හෝ ඉල්ලීමක් නොමැතිව, පෙරදිග ඉන්දියා වෙළෙද සමාගම විසින් හින්දු කෝවිල් 300 ක් යාපනේ අර්ධද්වීපය තුල සිය වියදමෙන් ඉදි කර ඇත.[1] එයින් නොනැවතී අවුමිල්දාර් නම් මද්‍රාසි බදු අයකරන්නන් පිරිසක් අධිකරණ බලතලද සහිතව පත් කලේය. මොවුන් සිංහල නිලධාරීන්ට වඩා ඉහල බලතල සහිත පිරිසක් විය. මේ හේතුව නිසා පෘතුගීසි හා ලන්දේසි සමග ක්‍රියාකල ආකාරයට වඩා අවමන් සහගත තත්ත්වයකට මුහුදුබඩ සිංහල ප්‍රධානීන් පත්විය. පොල් බදු හා අස්වැනි බදුවැනි අයකිරීම්, නිසා විරෝධයක් ඇතිවිය. එම විරෝධය කැරැල්ලක්

බවට පත් විය. හල්පිට හා පිටිපන වැනි වනගහනෙන් යුත් ප්‍රදේශවල හටගත් මේ කැරැල්ල මෙල්ල කර ගැනීමට මදුරාසි නිලධාරීන්ට නොහැකි විය.

රයිගම, හේවාගම, සියනෑ හා සල්පිටි කෝරළවලට පැතිරී ගිය මේ කැරැල්ලේ කම්පනය, මඩකලපුව, වන්නි හා යාපනය දක්වා පැතිරිනි. වනගත ගරිල්ලා සටනක් වූ මේ කැරැල්ල 1798 ඔක්තෝබර්වලදී නෝර්ත් ආණ්ඩුකාරයා පැමිනි පසු මර්දනය කලේ ගෙවල් දොරවල් ගිනි තැබීමෙන් හා වතුපිටි පාලු කිරීමෙනි. මර්ධනයෙන් පසු මේ විරෝධයට හේතු භූත වූ සියලුම ඉල්ලීම් ලබා දෙමින් දෙමළ ඔමිල්දාර්වරු ආපසු යවන ලදී. එම ඓතිහාසික සිදුවීම ගැන කුතුහලයක් ඇති වීමට ඉඟියක් මෙහි දක්වමි. එනම්, නෝර්ත් ආණ්ඩුකරයා විසින් 1799 මාර්තු 05 වැනිදා එංගලන්තයට යවන ලද ලිපියක[2] සදහන් කර ඇත්තේ "අප මොනවා කලත් යාපනේ ජනයා උඩරට රජුට හිතවත් වන අතර එහි සිදුවීම්වලට තදින් සංවේදී ය". යන්නයි. මෙයින් අපට වැටහෙන්නේ මදුරාසි පාලනය විසින් උඩරට රාජ්‍ය සමග යාපනේ ජනයාගේ තිබූ ලැදිකම නැති කිරීමට කටයුතු කර ඇති බවයි. එසේ නම් හින්දු කෝවිල් හැදුවේත් ඔමිල්දාර්වරු ගෙනාවෙත් රටේ ජනතාව අතර ගැටුමක් ඇතිකිරීමට මග පාදා ගැනීමට බව පෙනේ.

නෝර්ත් ආණ්ඩුකාරයා පැමිණි පසු උරටින් නියෝජිතයින් පැමිණ පලාත් බෙදා ගැනීම ගැන සාකච්ඡා කලත් ඊටඉට දීමට නෝර්ත් අකමැති විය. ඊට හේතුව ලෙස පෙන්වා දුන්නේ 1766 ගිවිසුම අනුව ක්‍රියා කිරීම සුදුසු බවත් ලන්දේසීන්ට එට ආපසු භාරදීමට සිදුවුවහොත් ඔවුන් අකමැති විය හැකි නිසා එය කළ නොහැකි බවයි. එහෙත් ඔහු ඇත්ත හේතුව සිය ආරක්ෂාව සදහා උතුර හා නැගෙනහිර අවශ්‍ය බවයි. ඉන්දියාවේ ආරක්ෂාවත්, ත්‍රිකුණාමල වරායත් ආපසු

ලන්දේසීන්ට වුවත් භාර නොදෙන බව ඔහු පවසා ඇත. උතුර නැගෙනහිර ඉංග්‍රීසීන් ....... කර ගැනීම ඔවුන්ගේ අභිලාශය බව ඉන් පෙනේ. එහෙත් අද වන විට එය දෙමළ අභිලාශය බවට පත්කර ඇත්තේ යටත්විජිතවාදීන් විසින්මය. රට භේදබින්න කරන්නේ එම වුවමනාව සපල කර ගැනීමටය.

## සර් ෆෙඩ්‍රික් නෝර්ත් යුගය



එම නිසා රට භේදබින්න කිරීමේ ක්‍රියාවලිය අත් හැරියේ නැත. ඊලඟට කලේ මේ ජාතීන් දෙකක් අතීතයේ සිට දිවයිනේ අයිතිය දෙකට බෙදාගෙන සිටි බවක් නෝර්ත්ට භාරදෙන වාර්තාවක සඳහන් කිරීමයි. වාර්තාවක් සැකසීමට හේතු වූයේ අදායම් හා අධිකරණ පාලනය සඳහා

ලන්දේසි ක්‍රමය නැවත අනුගමනය කිරීමට නෝර්ත් අදහස් කල නිසා, ඒ පිලිබඳ තොරතුරු දැන ගැනීමට ඔහුට අවශ්‍ය වීය. මේ සඳහා ක්ලේගෝන් විසින් 1799 ජූනි 01 දින ලබාදුන් වාර්තාවේ ගැටලු සහගත කොටස මෙසේය.


"Two different nations" from a very ancient period have divided between them the possession of the Island' First the Singalese inhabiting the interior of the country in its southern and western parts from the river Wallouve" to that of Chilow and secondly the Malabar who possess the northern and Eastern districts' These two nations differ entirely in their religion" language and the manners' The former who are allowed to be the earlier settlers drive their origin from Siam professing the ancient religion of that country."[3] මෙහි අදහස සිංහලෙන් මෙසේය. " එකිනෙකට වෙනස් ජාතීන් දෙකක් දුර අතීතයේ සිට දිවයිනේ අයිතිය ඔවුනොවුන් අතර දෙකට බෙදාගෙන සිට ඇත. පළමුව සිංහලයින් රටේ අභ්‍යන්තරයේද දකුනු හ බස්නාහිර කොටස්වල වලවේ ගඟේ සිට හලාවත දක්වාද වාසය කරන අතර දෙවනුව මලබාරයන් උතුරු හා නගෙනහිර අයිති කරගෙන් සිටී. මේ ජාතීන් දෙක ආගමෙන් භාෂාවෙන් හා සිරිත් විරිත් වලින් සම්පූර්ණයෙන්ම වෙනස් වේ. පළමු කී අය මුල් පදිංචිකරුවන් වන අතර ඔවුන් සියමෙන් පැවත එන එම රටේ පැරණි ආගමම අදහන්නේය." මෙය අනාගතයේ රට බෙදීමේ මොඩලක් බව පෙනෙනේ. මේ වාර්තාව ඉතිහාසයේ සැඟවී තිබුනත් 1953 දී රාජකීය ආසියාතික සංගමයේ ජර්නලයට මහාචාර්ය රැල්ෆ් පීරිස් ලියූ ලිපියකින්

පලමුවරට හෙලිදරව් කරන ලද අතර ඉන් පසු ජාතිවාදී දේශපාලනයේ පදනම එය විය.

## ප්‍රෝඩාවට හවුල් වූ නිලධාරීන්



හියු ක්ලේගෝන්



ජෝන් ඩොයිලි



ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන්

නෝර්ත්ගේ පාලන යුගය ගැන කථා කිරීමේදී ඔහු හා කටයුතුකල නිලධාරීන් ගැන යමක් කීම වැදගත් වේ. නිලධාරීන්ගෙන් පලමු වැන්නා හියු ක්ලේගෝන්ය. ඔහු ලංකාවට පැමිනියේ 1978 දීය. දෙවැන්නා 1799 පැමිනි ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන් ය. මෙයින් හියු ක්ලේගෝන් ලන්දේසි බසද, ඇලෙක් සැන්ඩර් ජොන්ස්ටන් දෙමළ, තෙලගු හා හින්දි බසද දැන සිටි අතර තෙවැන්නා වූ ඩොයිලි 1801 දි පැමිණ, මාතර සේවය කරද්දී සිංහල ඉගෙන ගත්තේය. මේ තිදෙනාගේ භාෂා දැනුම රටේ අනාගත අවුලට මග පාදා ගැනීමට ඉතා ප්‍රයෝජනවත් විය. මේ තිදෙනාගෙන් හියු ක්ලෙගෝන් වංචාවකට අසුවී කෙටි කලකින් සේවයෙන් පහකර රටෙන් පිටුවහල් කලේය.[4] ඔහුට පලමු යටත් විජිත ලේකම් තනතුර ලබාදීමේ පදනම මෙසේය. ඊට පෙර ලංකාවේ සිටි කාලයේ එනම් 1796 දී මුහුදුබඩ පලාත් සටනකින්

තොරව ලන්දේසීන් ගෙන් අල්ලා ගැනීමට හැකිවන පරිදි ලන්දේසීන්ට එරෙහිව මෙහෙයවූ කුමන්ත්‍රණයට කෘතගුන සැලකීම වශයෙනි. ලන්දේසි බස දන්නා නිසා ලන්දේසි වාර්තා ඇසුරින් ක්ලේගෝන් වාර්තාව පිලියෙළි කිරීමටත් ලන්දේසි සමග තිබූ ගනුදෙනු බේරා ගැනීමටත් අවශ්‍යම පුද්ගලයෙක් විය. නීතිය උගත් ඇලැක්සැන්ඩර් ජොන්ස්ටන් පිස්කල් අද්වකාත්වරයා ලෙස සේවය කලේය. ඔහු කුඩාකල මදුරාසියේ මූලික අධ්‍යාපනය ලැබූවෙකි. ඉන්දීය භාෂා උගත්තේ එහිදීය. ලංකාවේ සුලුජන කොටස් දෙමළ කතා කරන නිසා සිංහලයා සමග අනෙක් ජනකොටස් අතර තිබූ බැදීම බිඳදැමීමට ඔහු සුදුසුම පුද්ගලයා ජොන්ස්ටන් විය. මේ ඩොයිලි මැනවින් සිංහල ඉගෙනගත් නිසා උඩරට රාජ්‍ය විනාශ කිරීමට යොදාගෙන ඇත. ඩොයිලිගේ ක්‍රියාමාර්ග ඇරඹෙන්නේ මේට්ලන්ඩ් යුගයේය.



**තෝමස් මෙට්ලන්ඩ්**

ඩොයිලි රජයේ භාෂා පරිවර්තක වෙමින් උඩරට සමග ලිපි හුවාමාරුවත් තැගිබෝග හුවමාරුවත් කරමින් සිට රොබට් බ්‍රවුන්රිග් පැමිනි පසු උඩරට එරෙහි චර පුරුෂ සේවයක් ක්‍රියාත්මක කර සිංහල ඉතිහාසයේ කිරීටයේ කතාව කෙලවර කලේය. හියු ක්ලේගෝන් වර්තමාන අවුල නිර්මාණයට මුලපිරූ පුද්ගලයා වන්නේ ක්ලේගෝන් වාර්තාව නිසාය. යාපනේ ජනයා සිංහලයා සමග භේද බින්න කලේ ඇලෙක් සැන්ඩර් ජොන්ස්ටන් ය. මේ අපුරු තුන් දෙනාගෙනුත් හොදම මොලකාරයා ඇලෙසැන්ඩර් ජොන්ස්ටන් බව පෙනේ. මන්ද අනෙක් දෙදෙනාම මෙහෙයවා ඇත්තේ ඔහුය. නෝර්ත්, මේට්ලන්ඩ් හා බ්‍රවුන් රිග් යන තිදෙනාගේම පරිපාලන හා නිතිය පිලිබද උපදේශකයාත් මොහුය. භේ බෙදා පාලනයේ න්‍යායාචාර්‍යවරයාය. ඔහු වසර 20ක්(1799-1819) ලංකාවේ සිටිමින්ද ඉන්පසු එංගලන්තයට ගොස් වසර 30ක් (1819-1849) ද වශයෙන් අවුරුදු 50 ක් ලංකාව සම්බන්ධයෙන් කටයුතු කර ඇත. හියු ක්ලේගෝන් සුපුරුදු කුමන්ත්‍රනකරු නෝර්ත් ආණ්ඩුකාරයට එරෙහිවද කුමණ්ත්‍රනයක යෙදී ඇත. ලංකාව මද්‍රාසියෙන් වෙන්කර ක්‍රවුන් කොලනියක් කිරීම ගැන මද්‍රාසි නිලධාරීන් තුල තිබූ නොසතුට මේ කුමන්ත්‍රණයට හේතු වී ඇත.

රට භේදබින්න කිරීමේ දෙවෙනි පෙල කණ්ඩායම මෙසේය. පාර්සිවාල් අර්ක්ලන්ඩ් ඩයික් සිවිල් සේවකයකු ලෙස යාපනේ සේවයට පැමින 1824 සිට 1867 මිය යන විට එහි දීසාංණි ලෙස සේවය කලේය. ඔහු යාපනේ දිසාපති වූයේ 1833 දීය. බ්‍රිතාන්‍ය පාලන සමයේ උතුරු නැගෙනහිර දෙමළ කොලනි ඇති කිරීමේ ව්‍යාපෘතිය අධීක්ෂණය කල පුද්ගලයා ඔහුය. ඔහුට උතුරේ රජු යන නාමය පට බැදී තිබුනි. සයිමන් කාසි චෙට්ටි (1807-1860) 1824 කල්පිටියේ

උසාවියේ තෝල්ක මුදලි ලෙස පත්වී දෙමළ ඉතිහාස රචනා ඉංග්‍රීසීන් වෙනුවෙන් ලියූ පුද්ගලයාය.




**සයිමන් කාසිචිට්ටි**

ඔහු කල්පිටියේ කෝරලේ, පුත්තලමේ මුදලි, ව්‍යවස්ථාදායක සභාවේ සභික වී පසුව සිවිල් සේවයට උසස්විය.[5] ඒ ඒ කාලවල සිටි ආණ්ඩුකාරවරුන්ගේ නායකත්වයෙන් මේ ජාතිවාදී නාටකය ඉතා කූට ලෙස ගොඩනැංවීමට මොවුන්ද දායක වී ඇත. 1849 පසු වෙස්ලියන් පූජක පීටර් පාර්සිවාල් විසින් ආරුමුග නාවලර් ලවා (1822-1879) හින්දු ආගමික ව්‍යාපාරයක් කුලවාදයත් ජාතිවාදයත් හින්දු භක්තිකයිනට කාවද්දන ලදී. ඔහුගේ යෝජනවක් අනුව පොන්නම්බලම් රාමනාදන් ව්‍යවස්ථාදායක සභාවේ පලමු හින්දු භක්තික දෙමළ කතාකරන නියෝජිතයා විය.



**පොන්නම්බලම් රාමනාදන්**

එහෙත් ඔහුට ඒ වනවිට නිසිලෙස දෙමළ කතාකල නොහැකිවිය.[6] අරුමය නම් මේ තරම් උගත් සමාජයක් තිබූ යාපනයේ ජාතිවාදී දේශපාලනයට කොළඹින් කෙනෙකු ගෙනයාමයි. දෙමළ කතාකරන ජනතාව වෙනුවෙන් දෙමළ කතාකල නොහැකි පුද්ගලයකු මෙයින් පත් කෙරිණි. ඔහුව පත්කල ආණ්ඩුකාරයා හා යටත් විජිත ලේකම් ආපසු එංගලන්තයට කැදවූයේ මුදල් ගනුදෙනුවක් පොන්නම්බලම්ලා සමග කර තිබූ නිසාය. ඔහුගේ පත්වීම පිටුපස දූෂණයක් ද සිදුවී ඇති බව ඉන් පෙනේ. 1879 සිට ඔහු ආරුමුග නාවලර්ගේ වංචනික ඉතිහාසය පදනම් කරගෙන දේශපාලනයට ප්‍රවේශ විය. දේශපාලන කරලියේ එලිපිටම ජාතිවාදය රංගනයක යෙදුනේ ඔහුය. බ්‍රිතාන්‍යයින් ගෙතූ සමස්ත ජාතිවාදයේ නාටකය රඟ පැමට නාවලර් ලවා 1849 සිට හින්දු භක්තිකයින්ට පවරන ලදී.


ඉංග්‍රීසි පාලනයේ මුලදී රජයේ ප්‍රධාන ආදායම් මාර්ගය වුයේ මුතු කිමිදීම, කුරුඳු වෙළදාම, ඉන්දියාවට අරක්කු විකිණීම, පුවක්වලින් අයකරන තීරු බදු හා මුස්ලිම් ජනයා ගෙන් අයකල උලියම් බදුදවේ[7]. මේ උලියම් බද්ද (උලියම් බද්ද යනු ලංකාවේ සිටින රට වැසියන් නොවන අය ගෙවිය යුතු බද්දකි) මදුරාසි පාලන සමයේ එය අහෝසි කලත් නෝර්ත් නැවත පැනවීය.[8] 1800 පනවන ලද විනෝද බද්ද (කනකර ආදිය පාවිච්චි කිරීම වෙනුවෙන් අයකල) පැනවූවත් උඩරැටියන්ගේ කුමන්ත්‍රණයක් නිසා ඉන් අර්බුදයක් හටගෙන ඇත. මන්නාරමේ දී මේ ආභරණ බද්ධට එරෙහිව කටයුතු කලේ කුමාරසිංහ මුදලි වේ[9]. ඔහු දක්ෂ වෛද්‍යවරයෙක් වගේම දක්ෂ කවියෙකි. කුමාරසිංහ යනු අනුරාධපුර ශ්‍රී මහා බෝධිය ආරක්ෂා කරන බුලන්කුලම පරපුරේ කෙනෙක් බව සේපාලි මයාදුන්නේ විසින් ඇගේ ගවේෂනාත්මක නවකතාවක් වූ අන්තානිකනු පොතේ සදහන් කර ඇත. මේ අනුව පෙනෙන්නේ උතුරු පලාතේ මන්නාරමද සිංහල ප්‍රධානීන්ගෙන් පාලනය වූ බවයි.

අපිට නෝර්ත්ගේ පාලනය ගැන කතාකල යුතු තවත් දේ තිබේ. මේ කාලේ බ්‍රිතාන්‍යයින්ගේ ආගම් පිළිබඳ ලිබරල් ප්‍රතිපත්තිය මගින් කලේ බුද්ධාගමට තිබූ ප්‍රමුඛතාවය නැති කිරීමයි. එකල රෝමනු කතෝලික හා රෙපරමාදු පල්ලි අලුත් වැඩියා කිරීමට හා අලුතෙන් ඉදි කිරීමට භාණ්ඩාගාරයේ මුදල් වැය කර ඇත. මුස්ලිම් පල්ලි ඉදි කිරීමට නගරවලින් ඉඩම් ලබාදී ඇත. බෞද්ධ භික්ෂුන්ට පන්සලක් හෝ පාසැලක් ඉදි කිරීමට අවසර දී නැත. ක්‍රිස්තියානි පූජකයින් ආගමික දේශනා පැවැත්වීමට ගමක් ගානේ යෑමට නෝර්ත් උනන්දු කරවා ඇත.[10] යාපනේ කෝවිල් හැදීමද ඊනියා ලිබරල් ප්‍රතිපත්තියේම කොටසකි. මෙය බුද්ධාගමට තිබූ ප්‍රමුඛතාවය නැති කිරීමට යෙදූ උපායකි. ආගමික ලිබරල් ප්‍රතිපත්තිය ඊනියාය.

පිළිමතලව්වෙලා ගේ උපදෙස් අනුව 1800 දී උඩරට රජුට ආරක්ෂාව සැලසීමට ගිවිසුමක් අත්සන් කිරීමට ඉංග්‍රීසීන් තැත් කලත් උඩරට රජු එය ප්‍රතික්ෂේප කලේය. ඉන්දියාවේ තිබූ කුඩා රාජ්‍ය බොහොමයක් මෙවැනි ආරක්ෂක ගිවිසුම් නිසා අවසානයේ ඉංග්‍රීසීන් අතට පත් වී ඇත. 1799 දී නෝර්ත් ආන්ඩුකාරයාට සිංහල කුලක්‍රමය ගැන වාර්තාවක් ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන් එවක පිස්කල් අද්වකාත් විසින් සපයා ඇත. මෙයින් පෙනෙන්නේ සිංහලයින් අතර පවා ගැටුම් නිර්මාණය කිරීමට යත්න දරා ඇති බවයි.

ඊලඟ වැදගත්ම සිද්ධියන් ඉංග්‍රීසීන් 1803 දී උඩරට ආක්‍රමණය කිරීමයි. එම සටනේදී ඉංග්‍රීසි හමුදාව උඩරටදී සමූල ඝාතනය විය. ඉන්පසු උඩරට හමුදාව මුහුදුබඩ තිබූ ඉංග්‍රීසි බලකොටුවලට එකවර හදිසි පහරදීමක් කලේය. මීගමුව, හලාවත, පුත්තලම, මන්නාරම, යාපනය, මුලතිව්, ත්‍රිකුණාමලය, මඩකලපුව, හම්බන්තොට, තංගල්ල හා මාතර බලකොටුවලටද කොළඹට ආසන්න හංවැල්ලටද පහර දුනි[11]. මේ වනාහි ජයග්‍රාහී ලෙස දීපව්‍යාප්තව කල අවසාන යටත් විජිත විරෝධී ජාතික සටනයි. එමෙන්ම පුළුල් ජාතික සමගියක් විදාහා දැක්වූ අවසාන අවස්ථාවයි. මේ හදිසි එකවර ප්‍රහාරය කල් තබා දැන ගැනීමට ඉංග්‍රීසීන්ට නොහැකිවිය. ඒ නිසා පහතරට සිංහල ප්‍රධානීන් දෙපිටකාට්ටුවන් ලෙස බ්‍රිතාන්‍යයින් සලකීය. මේ සටනේ තවත් වැදගත් දෙයකි, කුරුදූගමුරට(මුලතිව්) පාලනය කල කුමාරසේකර මුදලි විසින් විශාල උඩරට හමුදාවක් සමග සමග මුලතිව් බලකොටුවට පහර දුන් අතර කැප්ටන් ඩ්‍රයිබර්ග් පසුබැස සිය හමුදාව සමග බෝට්ටු මගින් යාපනයට දිව්බේරාගෙන පැන ගොස් ඇත. මේ අනුව මේ ප්‍රදේශය සිංහල රජු සමග සටනට එක් වූ උඩරට රජුට අයත් ප්‍රදේශයක් බව තහවුරුවේ. මේ ප්‍රදේශය දෙමළ කොලනි ඇති කලේ හිතා මතාය[12]. අද එම ප්‍රදේශය වංචනික දෙමළ නිජබිමට අයිතියයි ප්‍රකාශ කරති.

# 1803 උඩරටින් පහරදුන් ඉංග්‍රීසි බලකොටු



තවද වන්නි බණ්ඩාරද මේ සටනේදී ඉංග්‍රීසීන්ට එරෙහිව සටන් කරමින් මන්නාරමේ වෙඩිතලතිව් බලකොටුවට පහර දී ඇත. යාපනේ බලකොටුවට පවා සිංහලයින් පහර දුන්නේය. ඔහු මුළු උතුරු පළාතම මේ සටනේදී උඩරට රාජ්‍යයේ බලයට නතුකර ගත්තේය.[13] රටේ ජාතික සමගිය තිබූ බව ඉන් පැහැදිලිව ඔප්පුවේ. මේ ගැන නෝර්ත් ආන්ඩුකාරයා කියා ඇත්තේ මෙසේය. "අපට අයත් ප්‍රදේශවල වසන පදිංචිකරුවන් කෙරෙහි උඩරට රජමාලිගය විසින් දැක්වූ බලමහිමය වනාහී බොහෝ කලක් තිස්සෙ පැවති එකකි. එය වනාහී ඔවුන්ගේ හෘදය සාක්ෂිය පාලනය කල බෞද්ධ භික්ෂූන් විසින් පරිස්සමින් වැඩි දියුනු කරනු ලැබූවකි." මෙයින් පෙනෙන්නේ බ්‍රිතාන්‍යයින් මුහුදුබඩ පලාත් පාලනය කලත් රටේ ජනතාව එකම අධ්‍යාත්මක බැම්මකින් බැදී සිටි බවයි.

මෙයින් පසු නෝර්ත් ආන්ඩුකාරයා ඉතා තිරශ්චීන ලෙස ගම්වැසි අහිංසක සිංහලයින්ගෙන් පලිගැනීමේ ආක්‍රමණ කීපයක්ම කලේය. මේ ක්‍රියා ගැන අණදෙන නිලධාරී තැන කියා ඇත්තේ "මහ රජ්ජුරුවන්ගේ ආයුධවලට පවා කරන ලද මහා නිග්‍රහයක් බව යි" . තවද සිංහල රජු විසින් ඉංග්‍රීසීන්ට යැවූ පිළිතුරු ලිපියක මෙසේ සදහන් වී ඇත. "නිරායුධ රට වැසියන් තලපෙලා දමා ගෙවල් දොරවල් ගිනිතබා කොල්ල කමින් මහා භීෂනයක් ඇතිකිරීම කළ හැක්කේ මෝඩ කුරිරු දාමරික මංපහරන්නෙකුට පමණි. එවන් දෙයක් සදහා නායකත්වය දෙන පුද්ගලයා මෙම ලෝකය කුමක්ද, නොදනී. එමෙන්ම ඒ තැනැත්තා යහපත් දේ කුමක්ද අයහපත් දේ කුමක්දැයි නොදන්නා මුග්ධ අයෙකි. එහෙත් රටක් පාලනය කරන බුද්ධිමත් පුද්ගලයකු කෙසේවත් එවන් ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙළඹෙන්නේ නැත."[14] මේ ප්‍රකාශනයෙන් පලිගැනීමේ ආක්‍රමණවල තිබූ හිංසාකාරී බව කොතරම්දැයි අනාවරණය වන අතර, උඩරට රජුගේ දේශපාලන

පරිනත බවත්, බුද්ධි මහිමයත් හෙළිදරව් වේ. මේ හිංසාවන් නිසා බොහෝ ප්‍රදේශ ජන ශූන්‍ය විය.

## කූටෝපායික තෝමස් මේට්ලන්ඩ් යුගය



මේ සිදුවීම් වලින් පසු 1805 ජුලි 19 වැනි දින තෝමස් මේට්ලන්ඩ් ආණ්ඩුකාරයා ලෙස පත්වීය. ඔහු පැමිනි උඩරට සමග යුද්ධය නතර කර ලිපි හුවාමාරුවක් ඇරඹීය. ඒ සඳහා ඩොයිලි දකුනු පලාතේ සිට කොළඹට ගෙන්වා ගෙන රජයේ භාෂා පරිවර්තක තනතුර පැවරීය. එම ලිපි මගින් මහානයක ස්වාමීපාදයන් ගේ මාර්ගයෙන් ආයාචනා ඉදිරිපත් කර සිටීම පමනක් නොව මහනුවර ප්‍රධාන කාර්යාධ්‍යක්ෂකවරයා හා රහස් ලියුම් ගනුදෙනුවක්ද, මේට්ලන්ඩ් පටන් ගත්තේය. යුද්ධයෙන් ලබා ගැනීමට බලා පොරොත්තු වූ හැම දෙයක්ම සෑම ලාබ ප්‍රයෝජනයක්ම , අල්ලස හා අයතා මාර්ගවල ආධාරයෙන්

ලබා ගැනීමට බලාපොරොත්තු විය. කපටි ක්‍රියාමාර්ගයෙන්, ඇත්ත වශයෙන් ඉතා අඩු මුදලකින් , කොයියන්ම අන්දමේ යුද්ධයෙකින් වුව අල්වා ගැනීමට නොහැකි වන සම්පූර්ණ අන්දමකින් උඩරට රාජ්‍ය අයත් කර ගැනීමට, මට පුලුවන් වනු ඇතැයි" මේට්ලන්ඩ් ප්‍රකාශ කර ඇත[15].

ඔහුගේ පලමු පියවර වුයේ පිස්කල් අද්වකාත් ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන් සමග මුහුදු බඩ පලාත්වල පලමු 6 මාසය තුලදී සංචාරය කිරීමයි. මේ සංචාරයේදී අලෙක්සන්ඩර් ජොන්ස්ටන් මේට්ලන්ඩ් ආන්ඩුකාරයාට උපදෙස් දී ඇත්තේ ජනශුන්‍ය වූ ප්‍රදේශවල හින්දු භක්තිකයින් පදිංචි කරන ලෙසටයි.[16] ජන ශූන්‍යවීම නෝර්ත්ගේ ක්‍රියා වල ප්‍රතිඵලයකි. මේ උපුටා ගැනීම බලන්න. "උඩරට රාජධානිය හා කෙරුනු යුද්ධ කරන කොටගෙන ණය ගැතිව සිටි බොහෝ දෙනෙක්ම, මරණයට පත්ව සිටි නිසා හෝ උඩරට රාජධානියට පලාගොස් සිටි නිසා හෝ වර්ෂ 1796 සිට 1803 අතරතුර කාලයේ මඩකලපුව සම්බන්ධ හිඟ මුදල් අයකර ගැනීම හෝ ඒවා ගැන සොයා බැලීම පවා නොහැකි විය."[17] නිත්‍ය පදිංචිකරුවන් මියයාම හෝ පලායාම සිදුවී ඇති බව ඉන් පෙනේ. ජනශූන්‍ය වීම නිසා හිස්වූ ප්‍රදේශවල හින්දු භකතිකයින් ඉන්දියාවෙන් ගෙනවිත් පදිංචි කරවීමට දුන් උපදේශය මුලසිටම අකුරටම ක්‍රියාත්මක කිරීමට බ්‍රිතාන්‍ය පාලනය පියවර ගෙන ඇති බව ඉතා පැහැදිලිව පෙනේ. එසේ නම් නිදහසින් පසු සිංහල කොලනි ඇතිකර දෙමළ නිජබිම ආක්‍රමණය කලායයි කියන්නේ සැබෑ ඉතිහාසය හිතාමතා අමතක කරමිනි.

මුහුදුබඩ සංචාරයේදී ජන විවිධත්වය තේරුම් ගත් මේට්ලන්ඩ් ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන්ගේ උපදෙස් අනුව වාර්ගික නීති හඳුන්වා දීම ඇරඹීය. බතාවිය පැත්තෙන් තොරතුරු ලබාගෙන මුස්ලිම් නීතිය පැනවීය.[18] 1806 දී ලංකාවට මුස්ලිම් නීතිය පැනවුවත් එංගලන්තයේ

දෙවැනි වැඩිම ජන සංඛ්‍යාව අද වන විටත් මුස්ලිම් වුවත්, මෙවැනි නීතියක් පනවා නැත. එසේ නම් ලංකාවට මුස්ලිම් නීතියක් 1806 දී පැනවූයේ මන්ද? ඊටත් වඩා මුස්ලිම් වූ පැරණි බෞද්ධ රටවලින් නීතිය ගෙනාවේ ඒවායේ  බෞද්ධාගම දිය කර හැරීමෙ ක්‍රම සැගව තිබූ නිසා විය යුතුය. ලන්දේසි බසින් තිබූ තේසවලමේ හා රෝමලන්දේසි නිතියද ඉංග්‍රීසියට පරිවර්තන කර යලි බලාත්මක කිරීමට කටයුතු කලේ ඔහුය. ලංකාවේ සුලුජන කොටස් භේදබින්න කර සිංහලයා හුදකලා කිරීමේ නීතිමය පදනම දැම්මේ මෙසේය. මුහුදුබඩ සංචාරයේදී ත්‍රිකුණාමලේ ගෝකන්න විහාරය සිංහල රජ කෙනෙක් හැදූ බව කියන සෙල්ලිපිය ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන් විනාශකර  වෙනත් සෙල්ලිපියක් සකස් කල බවට පෝල් ඊ පීරිස් මහතා සැකයක් සදහන් කරයි. කන්තලේ සෙල්ලිපියද වෙනස් කර ඇති බව පෙනේ. [19]

## රොබට් බ්‍රවුන්රිග් උඩරට ගිවිසුම හා ඌව වෙල්ලස මහා ජනසංහාරය



1812 රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරයා ලෙස පත්විය. මේ යුගයේ වැදගත් සිදුවීම් මෙසේය. උඩරට රාජ්‍යයට එරෙහිව චරපුරුෂ සේවයක් අරඹා එයද ජෝන් ඩොයිලිටම පවරනලදී. යාපනේ ඔක්සිලරි බයිබල් සොසයටි එක පිහිටුවීම.(Auxiliary bible Society instituted.) වෙස්ලියන්, ඇන්ගලිකන්, චර්ච් මිසන් හා බැප්ටිස් ආදී ක්‍රිස්තියානි නිකායන් වල ආගම් ලංකාවට ගෙන එන ලදී. චර්ච් මිශන් මිශනාරීන් ගෙන ඒම ඇලෙක්සැඩර් ජොන්ස්ටන් විසින්ම කල දෙයකි. 1813 දී ඇමෙරිකානු මිශනාරී සැමුවෙල් නෙවෙල් කල්කටාවට භාර නොගත් විට ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන්ගේ උපදෙස් අනුව ලංකාවට ගෙන්වා ගන්නා ලදී.[20] 1815 දී චරපුරුෂ සේවය සාර්ථක වී උඩරට රාජ්‍ය බ්‍රිතාන්‍යයට ගිවිසුමකින් පවරාගැනීමට හැකිවිය. උඩරට ඉංග්‍රීසීන් පවරා ගැනීම නිසා උද්ධාමයට පත් මරක්කල මිනිසුන් මහනුවර වීදිවල ඉස්ලාම් ආගමික පෙරහැරක් පවත්වා බෞද්ධ භික්ෂුවකටද අඩම් තේට්ටම් කර ඇත.[21] උඩරට රාජ්‍යයට මුස්ලිම් මිනිසුන්ගෙන් අයකල උලියම් බද්ද අහෝසි කලේය. මුස්ලිම් මිනිසුන්ගේ නඩුහබ කෙලින්ම ඉංග්‍රීසි නිලධාරීන් ලවා ඇසිමට සැලසීය. 1816දී ප්‍රභල ඇමෙරිකානු මිශනාරි කන්ඩායමක් යාපනයට පැමිනී අතර, බ්‍රවුන් රිග් ඔවුන්ට අලිමංකඩින් දකුනට ඒම තහනම් කලේ සිංහලයින් හමුවීම වැලැක්වීමටයි. 1817 වෙල්ලස්සේ හජ්ජි මරික්කාර් නම් මරක්කල මිනිසකුට මුහම්දිරම් තනතුරක් ලබාදීම නිසා උඩරට ගිවිසුම උල්ලංගනය විය. ඌව-වෙල්ලස්ස මහකැරැල්ල ආරම්භවීමේ ආසන්න හේතුව එයයි. කැප්පෙටිපොල එකතුවීමෙන් හා රජෙකු නම් කර තිබීමෙන් එය විමුක්ති අරගලයක් බවට පත්වීය. ඌවවෙල්ලස මහා කැරැල්ල ජන සංහාරයකින් මෙල්ල කලේය. උඩරට ගිවිසුම අහෝසිවන නව පරිපාලන නියෝගයක් නිකුත් කිරීමද මෙකල සිදු විය. 1819

ජනවාරි මස ගාල්ලට රැස්වූ මිශනාරීන් ලංකාව දෙමල හා සිංහල ලෙස දෙකට බෙදීමට තීන්දු කර ඇත්තේද මේ කාලයේය. මහනුවර අල්ලා ගනීමෙන් පසු බැරන්ට් දූරයක් දැරූ රොබට බ්‍රවුන්රිග්ට මහනුවර රජුගේ කිරුළ, සෙන්කෝලය හා ධජයේ සටහන් ස්වකීය සම්මානය ලාංඡනයෙහි ඇතුලත් කිරීමට III ජෝර්ජ් රජතුමා විසින් අවසර දී ඇත. මෙම සිද්ධි අතරින් රට භේදබින්න කිරීමට හා ජන පීඩනයට සෘජුවම බලපෑ කරුණු පමනක් සාකච්ඡා කිරීමට අපේක්ෂා කරමි. මෙහිලා වැදගත්ම දෙයක් වන්නේ ඌව වෙල්ලස්ස කැරැල්ලයි. ඒ පිලිබඳ ජෝන් ඩේවි ඒ පිලිබදව මෙසේ ලියා ඇත.

ඌව වෙල්ලස්ස කැරැල්ල ඉතා ජයග්‍රාහී මට්ටමකට ලඟා වෙමින් තිබිනි. ඒ ජාතික සටනේදී සිංහලයෝ ජයග්‍රහන නැමති හිනිමගේ අවසන් අඩියට පා තබා සිටියෝය. බ්‍රවුන් රිග් මෙසේ කියයිඃ "අතීතයෙහි අපි සටන් කලේ පෙරදිග බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයෙහි කීර්තිය සඳහායඃ අද අපි නම්බුව රැක්ගැනීම සඳහා සටන් කරමු. ඌව වෙල්ලස්සේ මිනිසුන්ට විරුද්ධව කරන මේ සටනේදී අප යොදවන තරම් විශාල යුද හමුදාවක් අපි මෙයට පෙර කිසි කලෙක නො යෙදවීමු. අප මේ සටනින් දිනන බව පෙවන්වන  ලකුනු නැත."[22]

බ්‍රවුන් රිග් විසින් එවන දොම්නස් සහගත  පණිවුඩ නිසා බැතර්ස්ට ද කම්පා වීය.  පසු බැසයාමට ජුලි මාසයේ උපදෙස් දුන් හෙතෙමඃ පසුව යුද්ධ  පිළිබඳ වූ ශෝකාකුල සිද්ධීන්ද, දැරීමට සුදුවන විශාල වියදමද "ඔවුන්ගේ පැරණි ආණ්ඩු ක්‍රමයට නැවත ආපසු යැමට උඩරැටියන් කෙරෙහි ඇති බවට පෙනෙන්නට තිබෙන ආශාවද සිය තර්කයට හේතු සාධක ලෙස ගෙනා පෑවේය. දැඩි සිතින් දික් ගැස්සීම කොහෙත්ම යුක්ති සහගත් නොවන හෙයින් කැරලි ගැසූ පලාත් වලින් ඉවත්ව යන හැටියට ඉන් පසු ඔහු පැහැදිලි ලෙස විධාන කලේය. ඒ

හැම විධානයක්ම ලැබුනේ බොහෝ කල් පසුවය. ඉන්දියාවෙන් ආ අමතර යුද සේනා පැමිණීම හා සමග කැරැල්ලේ බලවේගය බිඳීගියෙන් බ්‍රවුන්රිග් ද සිත් තැවුලෙන් බොහෝදුරට මිදුනි.[23]

ඌව-වෙල්ලස්ස විමුක්ති අරගලය මෙල්ලකිරීම සඳහා රොබට් බ්‍රවුන්රිග් විසින් දුන් සමූල ඝාතන නියෝගය කොයි තරම් කුරිරු හා දුෂ්ඨ එකක්දැයි ඔබට වටහා ගැනීමට එම නියෝගය මෙහි උපුටා දක්වමි.

*Dutch and the Portuguese only controlled seaports therefore only indirectly disturbed the rest of the country side*
GENERAL ORDERS; Commander-in- Chief & Government of Ceylon To Major D MacDonald Com'dng Officer Kandyan Provinces 1817-1820
**BROWNRIGG ORDERED MAJOR MACDONALD**
**THAT ALL MEN ABOVE 18 SHOULD BE KILLED.**
**ALL HOUSES PULLED-DOWN AND BURNE AND**
**ALL TREES BEARING FRUITS OF USE TO HUMANBEINGS, FELLED.**
**ALL GRAIN SHOULD EITHER BE DESTROYED OR CONFISCATED,**
**IRRIGATION TANKS AND CANALS SHOULD BE BREACHED**
**ALL CATTLE BELONGING, TO THE PEOPLE**
**WHICH WERE IN EXCESS OF THE**
**REQUIRMENTS OF THE ARMY SHOULD**
**FORTWITH BE DESTROYED**

**මෙහි අදහස සිංහලෙන් මෙසේය.**

ලන්දේසි හා පෘතුග්‍රීසි පාලනය කලේ මුහුදු වරායවල් පමනි, එනිසා සෙසු පිටිසරබද පළාත්වල අනියමින් කරදර තිබී ඇත.මහා නියෝගයයි; 18 ට වැඩි සියළු පිරිමින් මරාදැමීම, සියළු නිවාස කඩා පුලුස්සා දැමීම, සියළුම මිනිස් ආහාරයට ගත් හැකි පලදරන ගස් කපාහෙළීම. සියලුම ධාන්‍ය පවරා ගැනීම හෝ විනාශ කිරීම,වාරිජලාශ ඇල අමුණු කඩා

දැමීම, ජනයාට අයිති ගවයින්ගෙන් හමුදාවේ අවශ්‍යතාවයට වැඩි ප්‍රමානය මරා දැමීම

යටත් විජිතවාදීන් මිනිසුන් පමනක් නොව සතා සිව්පවාද, ගහ කොලද, විනාශකල බව පෙනේ. ඊනියා බ්‍රිතාන්‍ය ජාතිකයින්ගේ මානව හිමිකම් වැදිබන අපට අදත් දෙසති. මෙයින් ලක්ෂයකට ආසන්න පිරිසක් ඝාතනය වූ බව ජනප්‍රවාදයේ පවතී.

මිනිසුන් මෙතරම් පීඩනයකට ලක්කර ඉන් සෑහීමට පත් නොවූ ඉංග්‍රිසීන් මිෂනාරින් ගාල්ලට රැස්කරවා ලංකාව දෙමළ සිංහල ලෙස දෙකට බෙදීමටද තීන්දු කර ඇත.ඒ අනාගත නගිටීමක් වැලැක්වීමට රටතුලින්ම සතුරකු නිර්මානය කිරීම එමගින් සිදුවිය.. මේ තීන්දුවද ක්ලෙගෝර්න් වාර්තාවට අනුව කටයුතු කිරීමක් බව පෙනේ. එහි උපුටා ගැනීම මෙසේය."In January 1819 the missionaries met together again in Galle to hold their fifth Annual conference' The most important resolution of this meeting was the division of Ceylon in to two districts to be designated the Sinhalese and Tamil districts" [24] මෙහි අදහස සිංහලෙන් මෙසේය; 1819 ජනවාරි, සිය 5 වැනි වාර්ෂික සම්මේලනයට නැවත ගාල්ලටම මිෂනාරීන් රැස්විය. මෙම රැස්වීමේදී ගත් වැදගත්ම තීන්දුව නම් ලංකාව දිස්ත්‍රික්ක දෙකකට බෙදා සිංහල හා දෙමළ දිස්ත්‍රික්ක ලෙස නම් කිරීමයි. මේ අනුව පෙනෙන්නේ සුද්දන්ගේ ප්‍රයත්නයේ වගකීමක් මිෂනාරින්ටද භාර දුන් බවයි. එයි අධ්‍යාපනය මිෂනාරීන් අත තිබෙන නිසා අනාගත පරපුරටද මේ බෙදුම්වාදී අදහස් ව්‍යාප්ත කිරීමට හැකිවීය. එය අකුරටම ඉටුවී ඇති බව පෙනේ. අද සියලුම දේශපලන පක්ෂ ඊට එකවීමෙන් ඒ බව පෙනේ.

# උඩරටට පාරවල් හා කෝපි වගාවට ඉඩම්



**එඩ්වඩ් බාන්ස්**

මීලඟට එලඹෙන්නේ බාන්ස් හා පැජට් ආණ්ඩුකාරයන්ගේ යුගයයි. එකල සිදුවූ වැදගත් කරුණු කීපයකි. කඳුකරය හරහා පාරවල් කැපීම මගින් උඩරට සැපයුම් මාර්ග ශක්තිමත් කිරීම නිසා උඩරට පාලන බලයට ආරක්ෂාව සැලසුණි. මේ කාලයේම ඇලෙක්සැන්ඩර් ජොන්සටන් මූලිකත්වයෙන් එංගලන්තයේ හා අයර්ලන්තයේ රාජකීය ආසියාතික සංගමය පිහිටුවා දෙමළ ඉතිහාසයක් නිර්මාණය කලේය. අද දෙමළ සිංහල ඉතිහාස දෙකක් කතා කිරීමේ මුල එතනය. ක්ලේගෝන් ලියු බොරුව සැබෑවක් කිරීමේ උත්සාහය මෙයින් ඇරඹිනි. යාපනේ පාලනයට පාර්සිවාල් ආර්ක්ලන්ඩ් ඩයික් පත්වන්නේ කලින්ද සඳහන් කල පරිදි 1824 දීය. ඔහු එදා සිට 1867 මියයන තෙක්ම යාපනේ සේවය කල, ඔහුට උතුරේ රජු යන අන්වර්ථ නාමය ඔහුට පටබැඳී තිබුනි.[25] ඉන් පසු ඔහු යටතේම පුහුණුවූ සිවිල් නිලධාරියකු වූ විලියම්

ක්‍රොෆ්මන් ටවයිනම් (William Croftman Twynam) දිසාපති වී 1869 සිට 1895 දක්වා එක දිගටම සේවය කර ඇත.[26] ඩයික් යාපනය වෙනුවෙන් මුලු ජීවිතයම කැප කලේය. එහෙත් ඔහු ඩොයිලි මෙන්ම නොව විකල්ප සහිත අවිවාහකයෙකි. ඩොයිලි මියගොස් ඇත්තේ මේ වර්ෂයේය.1824 දී සයිමන් කාසිචෙට්ටි කල්පිටිය උසාවියේ තෝල්ක මුදලි විය. ඉතිහාසය අලුතෙන් ලියා පොළොවේ තිබෙන අපේ උරුමයන් වනසමින් සිංහල ප්‍රදේශවල ජනාවාස ඇතිකිරීම ආරම්භ කලේද මේ යුගයේය.

උඩරටට පාරවල් කැපීම පලමුවෙන්ම අවශ්‍ය වූයේ බලකොටු ඉදිකරීම වෙනුවට හමුදාව ඉක්මනින් ප්‍රවාහන කල හැකි මාර්ග සකස් කර ගැනීමටයි. ඊලගට සිදුවූයේ වනගහන එලිපෙහෙළිකර වෙළඳ වගාවන් සදහා ඉඩම් වෙන්දේසි කිරීමයි. උඩරට මහවනය එලිකිරීම නිසා දීර්ඝ ඉතිහාසය පුරා තිබූ ස්වාභාවික ජාතික ආරක්ෂාව අපට අහිමිවිය. දෙවැන්න දිය බෙත්මවල් වියලී දිය උල්පත් සිදීයෑමයි. ජාතියේ සෞභාග්‍යයේ රහස වූ කදුකරයේ ජල උල්පත් සිදීයාමත්, පස සෝදායෑම නිසා ගංගා වැලිවලින් පිරී ගොස් රටෙ ගංවතුර හානි වලට මග පැදුනි. කැලණිවැලි දුම්රිය මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘති වාර්තාවේ මේ ගැන සදහන් වන අතර දොස්තර එස්.ඒ.වික්‍රමසිංහ මහාගේ " ඉදිරිමග"[27] පොතේ මෙහි ප්‍රතිවිපාකද සමග ලියා දක්වා ඇත. සිය රහස් දේශපාලන ව්‍යාපාරය ආරම්භයේදී රෝහණ විජේවීර සිය මුල් දේශන 5 ටද මෙම කරුණු ඇතුලත් කර තිබු බව මට මතකය. එය ඉදිරි මග පොත ඇසුරින් සැකසූවක් බව පෙනේ.

# ආණ්ඩුකාර සහිත්‍යධරයා විල්මට් හෝර්ටන්



මීලගට විල්මට් හෝර්ටන් ආණ්ඩුකාරයා පැමිනි අතර ඔහු 1831 සිට 1837 දක්වා සේවය කලේය. එම යුගයේ වැදගත්ම සිදුවීම් වන්නේ කලාව හා සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීමයි. පුවත් පත් සඟරා පලවන්නට විය. මෙකල සාහිත්‍ය ප්‍රබෝධයෙන් ප්‍රයෝජන ගනිමින් ඉංග්‍රීසීන් ගෙතු ජාතිවාදී මත ලියා සමාජගත කලේ සයිමන් කාසිචෙට්ටිය. ඔහු මදුරාසි ගැසට් පත්‍රයට කුදිරමලේ පිලිබඳව ලිපියක් ලියා ඇත. එය දැනට සොයා ගැනීමට නැත. එහෙත් ඔහු ලියූ කෘති ලේඛනයේ සඳහන්වේ. මීලඟට වැදගත් වන්නේ CLR 63 අංකය යටතේ 1831 ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලකල ලිපියකි. එහි සඳහන් වන්නේ ත්‍රිකුණාමලේ ගෝකන්න විහාරයේ නටඹුන් හින්දු කෝවිලක නටඹුන් බව ලියා දැක්වීමයි.[28] පෘතුගීසීන් විසින් ගෝකන්න විහාරයේ

චෛත්‍ය තුන කඩා එහි ගඩොළු වලින් බලකොටුවක් ඉදිකලේ කලේ සිංහලයින් වරායට පැමිනීම වැලැක්විමට බව ක්වෙරෝස් නම් පෘතුගීසි ලේඛකයා ලියා ඇත. ලන්දේසීන්ද ඒ බව තහවුරු කර ඇත. ඉංග්‍රීසීන් එය හින්දු කොවිලක් බවට ගැසට් පත්‍රයේ ලිපියක් පලකලේ ත්‍රිකුණාමලේ ගෝකන්න විහාරය නටඹුන් පවා අපට අහිමි කිරීමටයි. හින්දු කෝවිලක කථාවක් ගෙතුවේ ගැටුමක් නිර්මානය කිරීමටයි. පාරම්පරික සිංහලයින්ගේ ඉඩම් හින්දු භක්තිකයින්ට බෙදා දී වරාය අවට පදිංචි කලේ වරාය තමන්ට නතු කර ගැනීමට මිස හින්දු ආගමට ඇති ආදරයක් නිසා නොවේ. මේ ලිපිය ලියූ කාසිචෙට්ටිද ඇන්ග්ලිකන් නිකායේ ක්‍රිස්තු භක්තිකයෙකි. සයිමන් කාසි චෙට්ටි I834 දී CEYLON GAZETTEER නමින් පොතක් ද 1847 මැයි 22දින ON THE HISTORY OF JAFFNA FROM THE EALIEST PERIOD TO THE DUTCH CONQUEST[29] පොතක් ද ඇතුලුව පොත් 13 කුත් ලිපි 29 කුත් ලියා ඇත. මේවාහි ලියා දක්වා ඇත්තේ රාජකීය ආසියාතික සංගමය මගින් නිර්මාණය කල අදහස් බව පෙනේ. මෙය බ්‍රිතාන්‍යයින් ගෙතූ වංචනික ඉතිහාසය උගත් දෙමළ ජනයාට කාවැද්දීමට ගත් උත්සහායකි.

හෝර්ටන් යුගයේ කල අපූරු දෙයක් නම්, නාඩගමක් රචනාකර රබන් සුරල් වයමින් උත්සව අවස්ථාවල ගයා සිංහලයා හෙලා දැකීමයි මෙහි රචකයෝ ක්‍රිස්තු භක්තික යෝය. එහෙත් ඔවුන් අයද සිටියේ හින්දු දෙවිවරුන්ගෙනි. එය පසුව වෙදිකා ගතකර ප්‍රසිද්ධ රඟහල් වල රඟ දක්වා ඇත. දැනුදු එය රඟ දක්වන අතර කොළඹ ජෝන් ද සිල්වා රඟහලේ ද වෙදිකා ගත්කර ඇත. මෙහි ඇත්ත කතාව යාපනේ දොන් ලුවිස් විසින් 1658 දි ලන්දේසි අල්ලාගත් යාපනේ බලකොටුව නැවත දෙවන රාජසිංහ රජුට අල්ලා දීමට ගත් ප්‍රයත්නයකි. යාපනේ වැසියන්

උඩරට රජුට තිබූ ලැදිකම සැබෑ කතාවෙන් පෙනේ. බැල්දියස් ලියූ ලංකා පුරාවෘත පොතේ සිංහල පරිවර්ථනයේ 426 පිටුවේ දැක්වේ.

මීලඟට හෝර්ටන් යුගයේ වැදගත්ම සිද්ධිය නම් කෝල්බෲක් ව්‍යවස්ථාවයි. එයින් රට පලාත් 5 කට බෙදූ අතර යාපනය විශාලම පලාත කර අනුරාධපුරය යාපනය යටතේ පාලනයට ලක් කලේය. පොළොන්නරුව නැගෙනහිර පලාතේ ත්‍රිකුණාමලයෙන් පාලනයට මග සැලසීය. දකුණ, බස්නාහිර හා බටහිර සිසු පලාත් වලට උඩරට රාජ්‍යයට අයිති ප්‍රදේශ වෙනත් පලාත්වලට යා කරන ලදී. එමගින් කුඩා මධ්‍යම පලාත උඩරටින් පාලනය වන ප්‍රදේශය බවට පත් කලේය. මෙය කලේ විශාල ප්‍රදේශයකින් ජාතිකත්වය නැවත කුළුගැන්වීම වැලැක්වීමටයි. රට කොටස් දෙකකට බෙදී තිබූ බව 1799 කියා, 1819 දී මිශනාරී රට දෙමල සිංහල ලෙස බෙදීමට තීන්දුකර, 1833 දී කොල්බෲක් කොමිසමෙන් ඊට අනුව පලාත් බෙදන ලදී. පලාත් බෙදීම ගැන මහචාර්ය බට්‍රිම් බැස්ටියන්පිල්ලේ NORTH CEYLON පොතේ පෙරවදනේ මෙසේ ලියා ඇත. "Briefly" Administrative system" especially at the provincial and district level was modelled on the organization formulated by Hugh Cleghorn at the beginning of the British rule." මෙහි කියවෙන්නේ, බ්‍රිතාන්‍ය පාලනයේ මුලදීම විශේෂයෙන් පළාත් හා දිස්ත්‍රික්ක මට්ටමෙන් පළාත් බෙදීමගැන මොඩලයක් හියු ක්ලේගෝන් විසින් ඉදිරිපත් කර තිබුනි. මෙලෙසින් හෝර්ටන්ගේ යුගය නිමාවිය. මෙයින් පෙනෙන්නේ බ්‍රිතාන්‍ය පාලනය හැමවිටම ක්ලෙගෝන් නමැති චෞරයාගේ මතයට අනුව ක්‍රියාකල බවයි.

## උග්‍ර ක්‍රිස්තියානි  ආණ්ඩුකාරවරු 1848 කැරැල්ලට හා පංච මහා වාදවලට මගපාදයි.





ස්ටුවර්ඩ් මැකන්සි                    කොලින් කැම්බල්            ටොරින්ටන්

එයින් පසු එලඹෙන්නේ උග්‍ර ක්‍රිස්තියානි ආණ්ඩුකාරවරුන්ගේ යුගයයි. මෙහි ප්‍රතිපලය ලෙස පංච මහා වාදවලට මග සැදුනේ ක්‍රිස්තියානි පූජකයින් බුද්ධාගමට කල අභියෝග නිසාය. 1848 මාතලේ කැරැල්ල ඇතිවන්නේ ආර්ථික අහේනිය පියවා ගැනීමට බදු අයකිරීමත්, කෝපිවගාවට ගැමියන්ගේ ඉඩම් බලෙන් පවරා ගැනීමත්, බෝගස් කැපීම ආදී හේතු නිසාය.  හතර මහ දේවාල මැද ක්‍රිස්තියානි පල්ලියක් ඉදිකලේ ද, ඇන්ගලිකන් ආගම රජයේ ආගම  කලේද මේ කාලයේය. දළදාවට  කලයුතු සැලකිලිද, නායක භික්ෂූන්ගේ පත්වීම් ලබා නොදීමද, දළදා මාලිගාවේ මුර භටයින් අයින් කිරීමද, මගින් උඩරට ගිවිසුමෙ බෞද්ධාගම වෙනුවෙන් තිබූ  බැඳීම් වලින් වැලකී සිටීමට මේ ආණ්ඩුකාරවරු පියවර ගත්තේය. මේ යුගයේ සිටි ආණ්ඩුකාරවරු නම් ස්ටුවර්ට් මැකෙන්සි (1837-1841) කොලින් කැම්බල්(1841-1847) වෛකවුන්ට් ටොරිංටන් (1847-1850) විලියම් ඇන්ඩර්සන් (1850-1855) වේ. මොවුන් ක්‍රිස්තියානි සභාවලද තනතුරු දැරූ නිසා බෞද්ධ

විරෝධීන් විය. දිගින් දිගටම බුදුදහමට හා බෞද්ධ භික්ෂූන් වහන්සේලාටද හිරිහැර කල ක්‍රිස්තියානි පූජකයින් බෞද්ධයාට අභියෝග කල අතර එය පිලිගත් භික්ෂුන් විවාද වලට එලඹුනි. එහිදී පැවැත්වූ වාද 5ක් පංචමහාවාද ලෙස ඉතිහාස ගතවන්නේ ලෝක පූජිත වෙමිනි. 1873 පානදුරාවාදයෙන් ලැබූ ජයෙන් පසුව නුවර කලාවිය නමින් අලුත් පළාතක් ඇති කලේය. අනුරාධපුරය උතුරු පළාතෙන්ද පොලොන්නරුව නැගෙනහිර පළාතෙන් ද ඉවත් කර, ඒ දෙකම ඇතුලත් වන පරිදි මේ අලුත් පලාත ඇති කලේය. ඉන්පසු සුද්දන්ගේ බෞද්ධ විරෝධී රළු ප්‍රතිපත්තිය වෙනස් විය. කොතරම් වෙනස් වූයේද කියතොත් ග්‍රෙගරි අණ්ඩුකාරයා ක්‍රියාකාරීවම බුදුසසුනට අනුබල දුනි. ඔහු බුදුදහම ඉගෙනීමටද උනන්දු විය. රුවන්වැලිසෑය ප්‍රතිසංස්කරණයට රජයේ මුදල් ආධාර ලබා දුනි. දාළදා මාලිගාවට අලංකාර පහන් දෙකක් තෑගි කර ඇත. විදුදය හා විදුලකර පිරිවෙන්වලටද ආධාර කලේය. " The fact that he was at the same time actively engaged in the attempt to dis-establish the Anglican Church provided positive proof of the state's neutrality in religion.[30] රාජ්‍ය ආගම ලෙස ඇන්ගලිකන් පල්ලියට තිබූ පිළිගැනීම අවලංගු කිරීමටද රජය නිරාගමික කිරීමටද ඔහු දායක විය. සරසවි සදරැස පුවත් පත සදහන් කලේ ග්‍රෙගරි ආණ්ඩුකාරයා බෞද්ධ පුනරුදයට සහය දෙන අතර බෞද්ධ විරෝධි ක්‍රිස්තියානි ප්‍රයත්නයන්ට අවහිර කරන බවයි. ආතර් ගෝර්ඩන් ආණ්ඩුකාරයාද එම ප්‍රතිපත්තියම අනුගමනය කර ඇත. බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ බෞද්ධාගම පිලිබද ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන්ම වෙනස්වීය. මේ අතර සිටි හෙන්රි වෝර්ඩ් ආණ්ඩුකාරයා කොළඹ නුවර දුම්රිය මාර්ගයට මුල පිරීය. ඉන් උඩරට කෝපි හා පසුව තේ වගාවටත් විශාල අනුබලයක් ලැබුනි.

# යාපනේ ක්‍රිස්තියානිකරණය අසාර්ථක නිසා ආරුමුග නාවලර් කලඑලි බැසීම හා මිත්‍රත්වයේ අනතුරට පිලියම්



මේ යුගයේ ආගමික ප්‍රබෝදය ගැන බැලීමට පෙර විශේෂයෙන් සලකා බැලිය යුතු කරුණු කීපයක් ඇත.1813 දී ගෙන්වාගත් ඇමෙරිකානු මිෂනාරීන්ට අලිමංකඩින් දකුණට ඒමට තහනම් කලේ, සිංහලයින් මුනගැසීම වැලැක්වීමටයි. ඇන්ග්ලෝ ඇමෙරිකානු යුද්ධය නිසා යම් සැකයක් තිබුනා විය හැක. ඔවුන් ගෙනා මුද්‍රණාලය නල්ලූර් වල ඇන්ග්ලිකන් පල්ලියේ තැබීමට නියම කලේද සැකයෙනි. ඇමෙරිකන් මිෂනාරීන්ට අවශ්‍යදේ මුද්‍රණය කර ගැනීමට ඉඩ දුන්නේ පාලනයක් යටතේය. 1819 ලංකාව දෙමළ සිංහල ලෙස දෙකට බෙදීම 1799 ක්ලේගෝන් සටහන අනුව සිදුකර ඇති බව පෙනේ. ඒ අනුව මේ

පළාත්වල ක්‍රිස්තියානි කිරීමේ ප්‍රයත්නයක් ගත්තේය. ඒ සදහා යොදා ගත්තේ මිෂනාරි අධ්‍යාපනයයි. අවසානයේ ඔවුන් තේරුම් ගත් පරිදි කොතරම් වෙහෙසුනත් යාපනේ ක්‍රිස්තියානියට හැරෙන සංඛ්‍යාව අපේක්ෂාකල තරම් නොවන බවය. American Board of Commissioners for foreign mission ආයතනයේ ලේකම් Rufus Anderson විසින් යටත් විජිත ලේකම් Emerson Tennent වෙත ලියා දක්වා ඇත්තේ ආගම මාරු කරන සංඛ්‍යාව ඉතා අල්ප බවත් ඔබලාගේ මධ්‍යස්ථාන අවට සිටින අයද කොතරම් දේශන අසා සිටියත්, පාසැල්වල ඉගෙන ගත්තත් ඔවුන්ගේ පැරණි ආගමම අදහමින් සිටින බවයි. පැරණි ආගමේ පදනම් දෙදරා ඇතත් ඔවුන් තවම එම ආගම අදහමින් සිටී. මෙයින් පෙනෙන්නේ යාපනේ ක්‍රිස්තියානි කිරීමේ ප්‍රයත්නය 19 වැනි සියවසේ පලමු අඩසියවස අපේක්ෂා කල තරම් ප්‍රගතියක් ලබා නැති බවයි. "Jaffna peninsula was saturated by Christian missionaries in first four decades of British rule." මෙහි අදහස මෙසේය. බ්‍රිතාන්‍ය පාලනයේ මුල් දසක හතර තුල යාපනය ක්‍රිස්තියානියෙන් පොඟවා තිබුනි. නමුත් ක්‍රිස්තියානියට හැරෙන ප්‍රමානය අපේක්ෂා කල තරම් නොවීය. එයින් පෙනෙන්නේ මිෂනාරි දැලට හසු නොවූ විශාල උගතුන් පිරිසක් යාපනේ සිටි බවයි. ඔවුන් දිවයින පුරා විසිරී සේවය කරන නිසා ඔවුන් සිංහලයින් සමග සුහදව සිටීමෙන් නැවත බ්‍රිතාන්‍ය විරෝධී කැරැල්ලක් ඇතිවුව හොත් යාපනේ උගතුන්ගේ සහාය ලැබෙතැයි ඔවුන් කල්පනා කරන්නට ඇත.

එහිලා, යාපනේ උගතුන් හා සිංහලයින් අතර වර්ධනය විය හැකි මිත්‍රත්වය අනතුරක් ලෙස පෙනෙන්නට ඇත. ඒ ප්‍රශ්නයට පිළිතුර ආරුමුග නාවලර් ගෙන ආවේය. "Navalar believed that the Christian Missionaries should be viewed as a gift from Shiva to

help awaken his community to discover their own dharma parth (puram) from which they had departed."[32] නාවලර් විශ්වාස කලේ සිය ජනයා නගා සිටුවීමට හා තමන් වෙතින් ඈත්ව ගිය ධර්ම මාර්ගය නැවත සොයා යාමටත් සිව දෙවියන් දුන් තැග්ගක් ලෙස ක්‍රිස්තියානිය දැකියයුතු බවයි. ආරුමුග නාවලර් මෙසේ කියමින් සිය ව්‍යාපාරය ආරම්භ කලේ පූජක පීටර් පාර්සිවාල් සමග මද්‍රාසියට ගොස් ආපසු පැමිනීමෙන් අනතුරුවයි. ඔහු බයිබලය සිංහලට පරිවර්තනය කලායයි කීවත් රත්නජීවන් හූල් මහතා එය හාස්‍යයට ලක්කරන්නේ නාවලර් ග්‍රීක් හා ලතින් භාෂා නොදන්නා බව කියමිනි. ඔහු ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමට මුල්තැන දෙමින් හින්දු පාසැල් ආරම්භ කල නිසා ඒවා ජනප්‍රිය විය. එහෙත් ගැහැනු දරුවන්ට හා පීඩිත කුලවල දරුවන්ට ආරුමුග නාවලර්ගේ පාසැල් තහනම් කරන ලදී. මිෂනාරීන් මෙන්ම ඔහුද දෙමළ ගුරුවරු මද්‍රාසියෙන් ගෙනෙන ලදී. නාවලර් සම්බන්දයෙන් ලන්ඩන් හි තේසම් පබ්ලිකේෂන් ආයතනයේ ටී.ජෙයබාලන් මහතා කියූ දෙයක් මෙහි උපුටා දක්වමි. " The Hindhu fundamentalist Arumuga Navalar "who was instrumental in institutionalising the cast system in Jaffna" is still somewhat respect by Jaffna Hindhu elite' As part of Saivite revivalism he helped to strengthen the worst aspect of cast discrimination' Arumuga Navalar opened the first Saivite school and barred oppressed-cast children and women from attending his schools' But such information is suppressed and Arumuga Nawalar is celebrated and popularised for the wrong reasons' Tamil in Sri Lanka were taught a history which is far from the truth'

Unfortunately the fake history of Arumuga Navalar is very much alive in modern Sri Lanka."[33] ඔහු කියන්නේ "හින්දු මූලධර්මවාදී ආරුමුග නාවලර් යාපනයේ කුලවාදය ස්ථාපනය කිරීමටමට කටයුතු කල අතර උසස් හින්දූන් විසින් තවමත් ඔහුට යම් ගෞරවයක් දක්වති. ඔහු කුලවාදයේ නරකම අංග හඳුන්වාදීමට කටයුතු කලේය. ආරුමුගනාවලර් පළමු හින්දු පාසල් ආරම්භ කල අතර පීඩිත කුලවල දරුවන්ට හා ගැහැණු දරුවන්ට එම පසැල් වලට පැමිනීමට ඉඩ නොදෙන ලදී. එහෙත් සැබෑ තොරතුරු වසන් කර ඔහු ගෞරවාදරයට ලක් කරන්නේ වැරදි හේතුවක් නිසාය. ඒ ශ්‍රී ලංකාවේ දෙමළ ජනයාට සත්‍යයෙන් ඇත් වූ ඉතිහාසයක් උගන්වා ඇති නිසාය. අවාසනාවකට නූතන ශ්‍රී ලංකාවේ ආරුමුග නාවලර්ගේ වංචනික ඉතිහාසය තවමත් පිළිගැනීමට ලක්වේ." ආරුමුග නාවලර්ගේ යෝජනාවක් අනුව පොන්නම්බලම් රාමනාදන් 1879 දී ව්‍යවස්ථාදායක සභාවේ සමාජිකයකු ලෙස පත්විය.[34] ඉන්පසු යාපනේ දේශපාලනයට කුලවාදය හා ජාතිවාදය රජ යන්නට විය. එහෙත් යාපනේ ජාතිවාදී දේශපාලනයට කොළඹ රාජකීය විද්‍යාලයේ සිසුවකු අවශ්‍ය වුයේ ඒ සඳහා උනන්දුවන්නකු යාපනේ නොසිටි නිසා විය හැක. යාපනේ හින්දු ආගමික පුනරුදයේ කිසි සේත්ම බ්‍රිතාන්‍ය විරෝධී හෝ අධිරාජ්‍ය විරෝධී හඬක් තිබී නැත. එහෙත් බෞද්ධ පුනරුදය සම්පූර්ණයෙන්ම යටත් විජිත විරෝධී හා අධිරාජ්‍ය විරෝධී දේශපාලන හඬක් නැගුනු ව්‍යාපාරයකි. පානදුරාවාදයේ බෞද්ධයාගේ ජයග්‍රහනයෙන් ඉංග්‍රීසි පරිපාලනය සලිත වූ බව පෙනේ. ලංකාවේ ජාතිවාදයේ පදනම, බ්‍රිතාන්‍යයින් ගෙතු බොරු ඉතිහාසයි. බොරු ඉතිහාසය ඉගැන්වීමට නාවලර් හවුල් නම් නම් ජාතිවාදයට ඔහුද වග කිව යුතුය.



පොන්නම්බලම් රාමනාදන්

## ඇමෙරිකානු මිෂනාරීන් සමාජ සේවයට බසී.



ඇමෙරිකානු මිෂනාරී පූජා සැමුවෙල් නොවෙල් 1813 දී ලංකාවට ගෙන්වා ගත්තේය.

මේ කාලයේ ඇමෙරිකානු මිෂනාරීන් සිය ක්‍රියාමාර්ගයන් වෙනස් කරමින් සාමාජ කටයුතුවල නිරත් වන්නට විය. ඔවුන් 1855 දී යාපනේ බැටිකොට්ටා සෙමනේරිය වසා දැම්මේය. එය බ්‍රිතාන්‍යා විශ්ව විද්‍යාලයක මට්ටමින් තිබූ බව අර්නස්ට් ටෙනන්ට් වරක් පවසා ඇත. නමුත් ඇමෙරිකානු අලුත් මගකට පිවිසිනි. එය අනාවරන වන ප්‍රකාශයක් මෙහි දක්වමි. "At the dawn of the 19 century the American missionaries came to Jaffna to preach Christian gospel" but actual fact they propagated the ideals of new nation pulsating life"[35] මෙයින් කියවෙන්නේ "19 වැනි සියවසේ අරුනැල්ලේ අමෙරිකානු මිෂනාරීන් යාපයට පැමිනියේ ක්‍රිස්තු ධර්මය ප්‍රචාරය කිරීමටයි. එහෙත් ඔවුන් ඇත්ත වශයෙන් කලේ ජන ජීවිතයට කාවදින ලෙස අලුත් ජාතියක් ප්‍රචලිත කිරීමයි" ජේන් රසල් සිය ආචාර්යය උපාධි නිබන්ධනය වූ COMMUNAL POLITICS UNDER DONOUCHMORE CONSTITUTION 1931-1947 පොතේ ලියා ඇත්තේ ලංකා දෙමළ ලෙස ලියා පදිංචි කර ඇත්තේ කලින් මලබාරයන් බවයි. මෙය පොන්නම්බලම් අරුනාවලම් රෙජිස්ටර් ජෙනරල් අවධියේ සිදුවී ඇත. දෙමළ ප්‍රෝඩාව කොතරම් ලස්සනට ගොතා ඇත්දැයි මෙයින් ඔබට වැටහෙනු ඇත. ඇමෙරිකානුවන්ට ප්‍රාභාකරන් බේරා ගැනීමට අවශ්‍ය වූ හේතුව මෙයින් ඔබට වැටහෙනු ඇත. ඉන්දියාවේ මෝදිගෙ හක්කේ බුදුරැස් බොක්කේ දඩමස් බව පෙනෙන්නේ බුදුබණ දෙසමින් ලංකාව දඩයම් කිරීමට කටයුතු කරන නිසාය. කොටින් හැදූවැඩූ ඉන්දිරාගේ පුතා ඊටම බිලිවීම පාරාවලල්ලකි. ශ්‍රී ලංකාවේ හමුදාව යුධ අපරාධ කලානම් ඊට වගකිව යුත්තේ කොටි හැදුවැඩූ අයයි.

මීලඟට යාපනේ ඉතිහාසය පිලිබඳව 1878 දී ලියූ යාල්පාන චරිත්‍රම් (HISTORY OF JAFFN) පොත එස්. ජෝන් නම් ඇමෙරිකානු මිෂනාරි ආගමේ පාස්ටර් වරයකු විසින් ලියා පලකර ඇත.[36] එයත් ඇමෙරිකානු මිෂනාරීන්ගේ තවත් ඊනියා සමාජ සේවයකි. යාල්පාන වෛපවමාලෙයි නමින් වූ පොත සී.බ්‍රිටෝ නම් වූ ඇන්ග්ලිකන් ආගමේ පෙරකදෝරුවකු විසින් ලියා ඇත. එය නාවලර්ගේ ප්‍රයත්නයේ එක් ඵලයකි. සී.බ්‍රිටෝ පොන්නම්බලම් රාමනාදන්ගේ මස්සිනාය. ඔහුද ක්‍රිස්තු භක්තිකයෙකි.යාපනේ ඉතිහාසය ලියූ සියලුම ලේඛකයින් ක්‍රිස්තු භක්තිකයින් ය. ඉන්පසු 1923 දී යාපනේ තෙලිප්පිලියි හි ඇමෙරිකන් මිෂනාරි මුද්‍රණලයේ පලකල ජෝන් එච්.මාර්ටින්(JOHN H' MARTYN)විසින් ලියූ NOTES ON JAFFNA පරිශිෂ්ඨය වෙන් කර ඇත්තේ යාල්පාන වෛපවමාලය 1736 ලියූ පැරණි පොතක් නොවන බවත් එය ව්‍යාජ රචනාවක් බවත් අනාවරණය කිරීමටයි.[37] මේවා යාපනේ දෙමළ ලේඛකයින් විසින් ම ප්‍රකාශ කරන්නේ නම් ඒවා පිළිගන්නවා විනා ඊට විරුද්ධ වෙමින් බොරු පණ්ඩිත කම් පෙන්වීමට හේතුවක් නැත. මෙයින් පෙනෙන්නේ ආරුමුග නාවලර් ඉංග්‍රීසීන්ගෙන් ඉගෙනගත් වංචනික ඉතිහාසය වෛපවමාලයේ අඩංගු බවයි. සුප්‍රසිද්ධ ANCIENT JAFFNA පොත ලිවීමට කරුණු ගෙන ඇත්තේද වෛපව මාලයෙනි. ඒ අනුව පැරණි යාපනය පොතද වංචනික පදනමක් ඇති පොතක් බව පෙනේ. රුහුණු විශ්ව විද්‍යාලයේ සිටි මහාචාර්ය සිරිමල් රණවැල්ල මහතා කියා ඇත්තේ යාපනේ රාජ්‍යයක් තිබූ බවට ඇති එකම සාක්ෂිය යාල්පාන වෛපවමලය පමනක් බවයි. යාපනේ උගතුන්ම එය ව්‍යාජ රචනායක් යැයි කියන්නේ නම් යාපනේ ඉතිහාසය ව්‍යාජ වෘතාන්ත වලින් පිරුණු ප්‍රෝඩවක් මිස සැබෑවන්නේ


කෙසේද? වඩාත් හාස්‍ය ජනක දේ නම් අපේ දේශපාලනඥයින් ඒ පදයට නටන නැටීමයි.

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය

ඊලගට 20 වැනි සියවස උදාවෙද්දී සිදු කල ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ කීපයක් ගැන සාකච්ඡා කරමු. කෝල්බෲක් ව්‍යවස්ථාවේ පලමු වෙනස වුයේ 1889 දී උඩරට සිංහල හා මුස්ලිම් වශයෙන් තවත් නිල නොලත් මන්ත්‍රීවරුන් දෙදෙනෙකු පත් කිරීමයි. එයින් නිල නොලත් මන්ත්‍රීන් සංඛ්‍යාවට 8 දෙදෙනෙක් විය. ඊලඟ ප්‍රතිසංස්කරණය නම් 1912 දී මැකලම් ප්‍රතිසංස්කරණයයි. එහිදී උගත් ලාංකිකයකු ඡන්දයෙන් තෝරා ගැනීමට අවස්තාව එලඹුනි. ඒ අවස්ථාවේ සිංහල ජනතාව පොන්නම්බලම්ගේ ජයග්‍රහනයට වැඩ කලේය. ඔහු තේරී පත්විය. එහිදී ජාතියට වඩා කුලය ලොකු වුනේ උතුරේ සැබෑ කතාව සිංහලයින් නොදැන සිටි නිසාය. අදත් ප්‍රශ්නය එයයි.

ඊලගට එන්නේ මැනිං ප්‍රතිසංස්කරණයයි. එයින් නම් කිරීමෙන් නියෝජිතයින් තේරීම වෙනුවට ඡන්දයෙන් තෝරා පත් කිරීමද හඳුන්වා දුණි. චන්දයෙන් 1921 දී 16 දෙනෙක් තෝරාපත් කර ගන්නට ලැබුනි. ජාතිමුලික, ප්‍රදේශ මූලක හා සංගම්වලින්ද ඡන්දයෙන් නියෝජිතයින් තෝරන ලදී. 1924 මැනිං ප්‍රතිසංස්කරන වලින් ඡන්දයෙන් තෝරන සංඛ්‍යාව 29 ක් විය. මෙහිදී මහා ජාතියේ නියෝජිත සංඛ්‍යාව වැඩි වෙද්දී සුලු ජනකොටස් වල උද්ඝෝෂන ඇති විය. පොන්නම්බලම්ලා අපූරු යෝජනාවක් කලේය. ඡන්ද බලය වෙල්ලාල වංශයේ පිරිමින්ට පමනක් හිමිවියයුතු යැයි ඔවුන් කීය. ඉතා පහත් නොදියුණු කුලවාදී ආකල්ප වලින් යාපනේ උගතුන් හිස පුරවාගෙන සිටින බව මෙයින් පෙනේ. 1931 දී ඩොනමෝර් කොමිසමේ අත් දැකීමෙන් පසු 50 ට 50

ඉල්ලා සිටියේය. ඒවා ප්‍රතික්ෂේප කලේ සිංහලයින් නොව අදාල කොමිෂන් සභාවලිනි. මලබාරයන් දෙමළ ජාතියක් කරවා දේශපාලන ගැටලුවක් කරා ගෙන ඒමට බ්‍රිතාන්‍ය පරිපාලනය ගතවූ වසර 150 තුල ඉතා සියුම් ප්‍රයත්නයක් දරා ඇත් බව පෙනේ. මෙහිදී තවත් වැදගත් කරුණක් කිවයුතුවම ඇත. 1799 කලේගෝන් ලියූ වාර්තාව ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන් පරිහරනයකරමින් සිට 1819 අපසු යනවිට එය තමන් අතින් අස්ථාන ගතවී ඇති බවත් එය පසුව රජයේ ලියකියවිල අතර තිබී හමුවෙනු ඇතැයි කියා ඇත. කිවූවාසේම ශත වර්ෂයකට වැඩි කාලයක් ගත වී වැවිලිකාර නියෝජිතයා ලෙස ව්‍යවස්ථාදායක සභාවේ සිටි තෝමස් නෝර්ත් ක්‍රිෂ්ටි විසින් රාජ්‍ය ලේඛනාගාරයට භාරදී ඇත. අරුමය නම් ශත වර්ෂයකට වැඩි කාලයක් මේ ලිවිල්ල තිබුනේ කොහේද යන්නයි.



## ප්‍රෝඩාව කරලිට ගෙන ඒමට පෙඩරල් පක්ෂය පිහිටුවයි

1848 දී රටට බ්‍රිතාන්‍ය පාලනයෙන් නිදහස ලැබුණි. 1949 දී පෙඩ්‍රල් පක්ෂය පිහිටු වන ලදී. එහිදී කල ප්‍රකාශය මෙසේය."Before the advent of the European nations to Ceylon in the 16th century" the people of this Island had their own governments' But the fact that must give rise to deep thought on our mind is that for a number of centuries preceding the advent of the Portuguese" the people of Ceylon had divided themselves into two nations¦ Sinhalese speaking nation and Tamil speaking nation'[38] 16 වැනි සියවසේ යුරෝපීය ජාතීන් පැමිනීමට පෙර මේ රටේ මිනිසුන්ට ඔවුන්ගේම ආණ්ඩු තිබිනි. නමුත් පෘතුගීසීන් පැමිනීමට පෙර සාධක අනුව අපේ ගැඹුරින් අපේ මනසට දැනෙන්නේ ලංකාවේ මිනිසුන් ඔවුනොවුන් අතර ජාතීන් දෙකක් ලෙස; සිංහල කතා කරන ජාතිය හා දෙමළ කතා කරන ජාතිය ලෙස බෙදී සිට ඇත.

## යුද්ධයට අත්වනයි.

1976 මැයි 14 වැනි දින ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ පිහිටවා වඩුක්කොඩෙයි හිදී කල ප්‍රකාශය මෙසේය..

"Whereas, throughout the centuries from the dawn of the history, The Sinhalese and Tamil nations have divided between themselves possession of the Ceylon, the Sinhalese inhabiting the interior of the country in southern and western parts from river Walawe to that of Chilaw and the Tamil possessing the Northern and Eastern districts( And" Whereas" the Tamil kingdom was

overthrown in war and conquered by the Portuguese in 1619" and from them by the Dutch and the British in turn" independent of the Sinhalese kingdoms" [39]

**මෙහි අදහස සිංහලෙන් මෙසේය.**

ඉතිහාසයේ මුල සිට ශතවර්ෂ ගනනාවක් තිස්සේ සිංහල හා දෙමළ ජාතීන් අතර ලංකාවේ අයිතිය ඔවුනොවුන් බෙදාගෙන සිටි අතර සිංහලයන් රට අභ්‍යන්තරයේද දකුණු හා බස්නාහිර පළාත්වල වලවේ ගගෙ සිට හලාවත දක්වාද, ද්‍රවිඩයින් උතුරු හා නැගෙනහිර දිස්ත්‍රික්ක අයිති කරගෙන සිටී. දෙමළ රාජ්‍ය පෘතුගීසීන් විසින් 1619 දී යුද්ධයකින් පරාජය කර අල්ලාගත් අතර ඔවුන්ගෙන් ලන්දේසීන් සහ බ්‍රිතාන්‍යයින් අතටපත්ව තිබී නිදහස සිංහල රාජ්‍යයට ලබා දෙන ලදී.

අවස්ථා දෙකකදී පෙඩරල් පක්ෂයේ නායකයා ලෙසත් ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුනේ නායකයා ලෙසත් චෙල්වනායගම් කල ප්‍රකාශ දෙක සංසන්දනය කර බැලුවහොත් වෙනසක් පෙනේ. ඊට හේතුව 1976 ප්‍රකාශය වඩාත් 1799 ක්ලෙගෝන් වාර්තාවට ආසන්න වීමයි. ඊට හේතුව ක්ලේගෝන් වාර්තාව රැල්ෆ් පීරිස් මහතා ලියා පලකලේ 1953 දීය. පෙඩරල් පක්ෂය 1849 දී පිහිට වන විට ක්ලේගෝන් වාර්තාව ගැන නොදැන සිටින්නට ඇත. ඊලඟ කාරනය සිංහලයින් සියමෙන් පැවත එන බවට වූ ක්ලේගෝන් සටහනේ වූ සඳහන ද්‍ර.එ.වි.පෙ. ප්‍රකාශයට නොගැනීමයි. එයින් පෙනෙන්නේ එය කාටත් වැටහෙන බොරුවක් නිසා එය සැඟවීමට උත්සාහ දරා ඇතිබවයි. තවද 1800දී කුමාරසිංහ මුදලි, 1803 දී කුමාරසේකරමුදලි හා වන්නි බන්ඩාරගේ කටයුතු වසං කරමින් කරුණු ඉදිරි පත්න්කර ඇත.

## සිංහල රජුගෙන් යාපනය පෘතුගීසීන් උදුරා ගැනීම

මේ ප්‍රකාශ දෙකටම පොදු දෙයකි පෘතුගීසි ආක්‍රමනයකින් යාපනේ දෙමල රාජ්‍ය විනාශ වූ බවට වූ සදහන. 1619දී යාපනේ රාජ්‍ය පෘතුගීසීන් උදුරාගත්තේ උඩරට රජුගෙනි. එහිදී යාපනේ සිටි මිගපුල්ලේආරච්චි නම් මුදලි විසින් රජුගේ දියණියන් දෙදෙනා සගවා ගෙන සිට උඩරටට ගෙන ගොස් බදුල්ලේ කුමාරසිංහ කුමාරයාටත් මාතලේ විජයපාල කුමාරයාටත් විවාහ කරදී ඇත.[40] මින් යාපනේ රාජ්‍ය නැවත්තත් උඩරටට අයිති විය. ඉන්පසු 1626 උඩරට සෙනරත් රජු නැවත යාපනය අල්ලා ගත්තත් ඔහු පසුව සටනින් පරාජයට පත්විය, යාපනේ අවසාන රජුගේ අමාත්‍ය මණ්ඩලයේ සිටි අනද අමරකෝන් උඩරටින් යාපනේ රාජ්‍යයට පත්කර සිටි නියෝජිතයාය. මේ හැම දේකින්ම පෙනෙන්නේ යාපනේ රාජ්‍යය උඩරට අයිතිව තිබූ බවයි. යපනේ රාජ්‍ය උඩරට රාජ්‍යයට යටත් ප්‍රදේශයක් බව යාල්පාන වෛපව මාලය ඉංග්‍රීසි පොතේ xxxviii පිටුවේ සදහන් වේ.

1613 අගෝස්තු 13 දින උඩරට සෙනරත් රජු කැදවූ රාජසභාවට පැමිනි නියෝජිතයින්මෙසේය. ඊට සහභාගිවූවෝ නම්. කොට්ටියාරමේ රජු ඉඩැල්ලේ, පාලුගම රජු සෙල්ලේ බන්ඩාර, පාලුගම රජු කුමාර බන්ඩාර, පානම රජ සමරවීර, යාපනේ රජුගේ දූතයා වූ නමච්චාර්, ඌවේ රජ රත්වත්තේ, මීගමුවේ මාර්සල්ස් කුමරු, වෙල්ලස්සෙ කුමරු මැතිරල්හාමි, කොත්මලේ කුමරු ජලගොඩරාල; මීවතුරේ කුමරු මීවතුරේ රාල පුත්තුර්හි කුමරු හා මහනිල්මේ ජනේසංගති; හතර කෝරලේ ආදිපාද වික්‍රමසිංහ; හරිස්පත්තුවේ අධිපති ගෝල්හෙනරත්; උඩුගොඩ අධිපති කොරොප්පේ; මාතලේ අධිපති හා නිලමේ වනසිංහ; අළුත්ගම සහ පස්ගොඩ අධිපති අතපත්තු හා අට්ටාපිටියේ සහ විල්වල අධිපති හල්වැන් රාල යන අය සමග වෙනත් අධිපතීන් විය.(බැල්දියස්)[41]

## ක්ලේගෝන් නැමති සොරදෙටුවා යලි සිහිපත්වෙයි

වංචනික ජාතිවාදී දේශපාලනයේ ප්‍රභලම සාක්ෂිය හියු ක්ලේගෝන් නම් පල්හොරෙකු ලියූ වාර්තාවකි. ඉන්දියාවෙ අගමැතිව සිටි රජිව් ගාන්ධි වෙත 1987 දී ද.වි.එ.වි. පෙරමුණ ලියූ ලිපියක ද ලියා ඇත්තේ ලංකාවේ පළමු යටත් විජිත ලේකම් හියූ ක්ලේගොන් සදහන් පරිදි උතුරු නැගෙනහිර පළාත් ඔවුන්ගේ සම්ප්‍රදායික නිජ බිම බවයි. ලංකාව පමනක් නොව විදේශ රටවල් ද මේ ප්‍රෝඩවෙන් රවටා ඇතිබව ඉන් පෙනේ. අපට අවශ්‍ය කරන්නේ ඉංග්‍රිසීන් පැමිනීමට පෙර තිබූ  සිංහලයාගේ ප්‍රමුඛත්වයෙන් සියලු ජන කොටස් වලට සාමයෙන් සිටිය හැකි රාජ්‍යයකි. මේ රචනය හුදෙක්ම ජාතිවාදයේ ප්‍රෝඩාව හෙළි කිරීම සදහාම කල රචනයකි. සමගිය බලයවේ!

**පියසිරි අමරකෝන්**

සටහන්;


1. S.Rathnajeewan H' Hoole" The Exile Returned( Page 11
2. ශ්‍රී ලංකා ජාතික ලේකනාගාරය 7/1 පී 409
3. Ralph Pieris, Administrationof Justice and Revenue on the Island of Ceylon under the Dutch Government, Journal, R.A.S. (Ceylon) Vol. iii (New Series) 1953 Page 125
4. Ibid Page 128'
5. D.P.E. Hettiaratchi, SOME LETERARY UNDERTAKINGS OF The late Simon Casie Chitty, Journal of R.A.S. (Ceylon) [Vol xxx] page 455
6. Jane Russell, COMMUNAL POLITICS page 80, එස්.ඩබ්.ආර්.ඩී. බන්ඩාරනායකටද එම ප්‍රශ්නයම තිබීය.
7. එච්.ඩබ්ලිව්. කොඩ්‍රිංටන්, සංක්ෂිප්ත ලංකා ඉතිහාසය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, පිටුව 166.
8. එම 166
9. John H' Martyn, Notes on Jaffna, Chronological, Historical, Biographical, American Ceylon Mission Press Tellippalai, Ceylon, 1923 page 09
10. K.M. De Silva prof, A History of Sri Lanka page 283
11. ආචාර් ය කොල්වින් ආර්. ද සිල්වා.අධිනීතිඥ, බ්‍රිතාන්‍යයින් යටතේ පැවති ලකාව 195-1833 පිටුව 126.
12. Simon Casie Chitty, Modliar, CEYLON GAZAETTEER 1834 Cotta Church Mission Press 1834, page 166, 219
13. ibid
14. පෝල් ඊ. පීරිස්, ත්‍රී සිංහලය, පරිවර්තනය, අභය හේවාවසම්, පිටුව95
15. ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා.අධිනීතිඥ, බ්‍රිතාන්‍යයින් යටතේ පැවති ලංකාව 1795-1833 පිටුව 138
16. Sir Alexander Johnston Knt. V.P.R.'P.S. (to The Secretary, of the Royal Asiatic Society)

https:doi.org/10,1017/5095047370000380 Published on line by Cambridge university press page,537, 537+

17. එච්.ඩබ්ලිව්. කොඩ්‍රිංටන්, සංක්ෂිප්ත ලංකා ඉතිහාසය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, පිටුව 132
18. John H. Martyn, Notes on Jaffna, page 10
19. Paul E. Pieris CEYLON THE PORTUGUESE ERA Vol 1 page 330 foot note 3
20. S. Ratnajeevan H. Hoole, The Exile Returned: page 23
21. කුමාර සිරිවර්ධන, පරිවර්තනය, චරපුරුෂ ජෝන් ඩොයිලි ගේ දින පොත, පිටුව 33
22. ඇල්ලේපොල එච්.එම්. සෝමරත්න, ඩේවි දුටු ලංකාව, xiii පිටුව
23. ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා.අධිනීතිඥ, බ්‍රිතාන්‍යයින් යටතේ පැවති ලකාව 1795-1833 පිටුව 202
24. Rev. J. Brown, The Missionary Conference: South India and Ceylon 1879,VOLUME ii,xx. - The Wesleyan Methodist mission, North Ceylon page 808
25. Bertram Bastiampillai Professor Northern Ceylon (Sri Lanka) in 19th Century, introduction page ix
26. John H. Martyn, Notes on Jaffna. Chronological, Historical, Biographical, American Ceylon Mission Press Tellippilai press. Page 10
27. දොස්තර එස්.ජේ.වික්‍රමසිංහ, ඉදිරිමග, (ලංකාවට ආර්ථික ප්‍රතිපත්තියක, 8 පරිච්ඡේදය හෝදා පාළුව පිටුව6
28. Indiophilus (Simon Casie Chitty) , Clpitiya, 21 november 1831,C.L.R. 63 Ceylon Government Gazette
29. Simon Casie Chitty C.M.R.A.S. READ 22 MAY 1847On the history of Jaffna from the Earliest Period to The dutch Con,quest

30. K.M.De Siliva professor, Sri Lanka Troubled Inheritance page 144.
31. S.Ratnajeevan H' Hoole, The Exile Returned: page 11
32. Arumuga navalar, Wikipedia, Biography https://en.m.wikipedia.org>wiki
33. S. Ratnajeevan H. Hoole, HERITAGE HISTORIES, Publisher’s Note page vii
34. එම.
35. ACM,Google(American Ceylon Mission) Social impact
36. කේ.එන්.ඕ.ධර්මදාස, ජාත්‍යානුරාගය,සමාජ ශාස්ත්‍රීය විමර්ශනයක්. පිටුව 200, මෙම කරුණ NOTES ON JAFFNA පොතේ පරිශිෂ්ඨයේ PAGE XXII අංක 6 යටතේ දැක්වේ.
37. John H. Martyn, NOTES ON JAFFNA, APPENDIX PAGE, vii
38. Kamalika Pieris, Statementmade by illankai Tamil ArasuKadchi(ITAK)1949 and 1976, Posted on Septwmber 12th 2023
39. Wadukkodai resolution, [Tamil Net, Sunday,08 June 1997, 23.30 GMT] held at Vadukkodai,14 may 1976
40. Rev. fernao De queyroz, The Temporal and Spiritual Conquest of Ceylon, page. 63
41. බැල්ඩියස්ගේ ලංකා පුරාවෘත්තය, පරිවර්තනය, බී.එන්. ආර්. ජයසේන, PHILIPPUS BALDAEUS, පිටුව 122